කාර්යසාධන වාර්තාව 2022

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 283



වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

අන්තර්ගතය

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1: හැඳින්වීම 1

1.2: ආයතනයේ දැක්ම, මෙහෙවර 3

1.3: ප්‍රධාන කාර්යයන් 4

1.4: සංවිධාන සටහන 5

1.5: දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 7

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 12

2.1: ලබාගන්නා ලද ප්‍රගතිය 12

2.2: 2022 වසරේ ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් 39

2.3: 2022 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණදීමට සිදු වූ අභියෝග 42

2.4: වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම 44

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය 45

3.1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 45

3.2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 46

3.3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 47

3.4: මූල්‍ය ප්‍රකාශ සටහන් 48

3.5: ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 49

3.6: වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 49

3.7: මු.රෙ 208.ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 50

3.8: මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 50

3.9: විගණකාධිපතිවරයාගේ වාර්තාව 51

04 පරිච්ඡේදය

කාර්යසාධක දර්ශක 72

4.1: කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 72

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 75

5.1: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 75

:5.2තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 77

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ 79

6.1: සේවක සංඛ්‍යා කළමනාකරණය 79

6.2: ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය .. 79

6.3: මානව සම්පත් සංවර්ධනය 80

6.4: දේශීය පාඨමාලා 80

6.5:2022 වසරේ විශ්‍රාම ගැනීම් 85

6.6: සේවයෙන් ඉල්ලා අස්වීම් /තනතුරුවලින් නිදහස් වීම 85

6.7: මියගිය නිලධාරීන් පිළිබඳ විස්තර 85

6.8: විනය කටයුතු 85

6.9: සේවය අත්හැර යාම් 86

6.10: දෙපාර්තමේන්තු විභාග 86

6.11: පුහුණු වැඩසටහන් 86

6.12: ණය ලබාදීම 88

6.13: තොරතුරු අයිතිවාසිකම් ඒකකය 88

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව 89

7.1:අනුකූලතා වාර්තාව 89

වගු ලැයිස්තුව

වගුව 02-1: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022 14
වගුව 02-2: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022- නඩත්තු 14
වගුව 02-3: මිලියන 3500 විශේෂ වැඩසටහන - 2022 15
වගුව 02-4: මිලියන 3500 විශේෂ වැඩසටහන -2022 15
වගුව 02-5: ප්‍රාදේශීය කාර්යාල වලින් ලැබෙන සංචාරක ආදායම් හා සංචාරක පැමිණීම් තොරතුරු (2022.01.01 සිට 2022.12.31 දිනට) 21
වගුව 02-6: සංචාරක බංගලා වෙත පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව හා ආදායම 22
වගුව 02-7:සංචාරක බංගලා වලින් ලද ආදායම 24
වගුව 02-8: දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන් 28
වගුව 02-9: දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන් 28
වගුව 02-10: බීජ පැළ නිෂ්පාදනය 29
වගුව 02-11: නව ගොවි වන වගා ස්ථාපනය 30
වගුව 02-12: 2020/2021 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම 31
වගුව 02-13: වෙරළබඩ වන වගා ස්ථාපනය 32
වගුව 02-14: ගෙවතු සංවර්ධනය සහ ගෙවතු කළමනාකරණය 32
වගුව 02-15: මිනුම් කිරීම හා මායිම් සලකුණු කිරීම 34
වගුව 02-16: නව වන කළමනාකරණ කටයුතු 35
වගුව 02-17: 2022 වර්ෂයේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ ලබාගත් බදු ප්‍රමාණය 37
වගුව 02-18: පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 37
වගුව 02-19: නැවත වන වගා කිරීම සඳහා බීජ පැල නිෂ්පාදනය 38
වගුව 02-20: රජයේ වනාන්තර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම 41
වගුව 03-1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 45
වගුව 03-2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 46
වගුව 03-3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 47
වගුව 03-4 : ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 49
වගුව 03-5: ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 49
වගුව 03-6: මු.රෙ.208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 50
වගුව 03-7: මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම 50
වගුව 04-1: ආයතනයේ කාර්යසාධන දර්ශක 72
වගුව 05-1: හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 75
වගුව 06-1: සේවක සංඛ්‍යා කළමනාකරණය 79
වගුව 06-2: 2022 වසරේ බඳවාගැනීම් 80

වගුව 06-3: දේශීය පාඨමාලා 80
වගුව 06-4: 2022 වසරේ විශ්‍රාම ගැනීම් 85
වගුව 06-5: සේවයෙන් ඉල්ලා අස්වීම්/තනතුරුවලින් නිදහස් වීම 85
වගුව 06-6: මියගිය නිලධාරින් පිළිබඳ විස්තර 85
වගුව 06-7: විනය කටයුතු 85
වගුව 06-8: සේවය අත්හැර යාම් 86
වගුව 06-9 : වෙනත් පුහුණු 86
වගුව 07-1: අනුකූලතා වාර්තාව 89

ඡායාරූප ලැයිස්තුව

රූපය 02-1: වන ආවරණය ඉහළ නැංවීම 13

රූපය 02-2: රත්න ඇල්ල තෙක් මාර්ගය කොන්ක්‍රීට් කණු ඉදිකර විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම 16

රූපය 02-3: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ආදර්ශ මොඩියුලය නවීකරණය කිරීම 16

රූපය 02-4: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අදාල REEC මධ්‍යස්ථානයේ කබානා ගොඩනැගිල්ල සඳහා තිරරෙදි සවිකිරීම 17

රූපය 02-5: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය සඳහා ඇඳ ඇතිරිලි හා ඇඳ ලෑලි යොදා නවීකරණය කිරීම .. 17

රූපය 02-6: කුරුළු උයන ප්‍රධාන ගොඩනැගිල්ල ආශ්‍රිතව මාර්ගය පිඩලි ඇල්ලීම හා ගේට්ටුව ඉදි කිරීම 18

රූපය 02-7: මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ස්වාභාවික මංපෙත් නඩත්තුව හා කුරුළු නැරඹුම් මධ්‍යස්ථානය සකස් කිරීම 18

රූපය 02-8: මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය සැකසීම හා වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම 18

රූපය 02-9: සංචාරකයින්ගේ සහ නිලධාරීන්ගේ වැසිකිලි නවීකරණය කිරීම 19

රූපය 02-10: ගල්ඔය පාරිසරික උද්‍යානයේ සඟාරි ජීප් රථ මාර්ගයේ කි.මී.02ක ප්‍රමාණයක් වැඩි දියුණු කිරීම 19

රූපය 02-11: ගල්ඔය පාරිසරික උද්‍යානයේ සඟාරි ජීප් රථ මාර්ගයේ කි.මී.02ක ප්‍රමාණයක වැඩි දියුණු කල කොටසේ කොන්ක්‍රීට් කෝසු ස්ථාපිත කිරීම 19

රූපය 02-12: පිටදෙනිය වතුගල ප්‍රවේශපත්‍ර කවුළුව ස්ථාපිත කිරීම 20

රූපය 02-13: සංචාරක බංගලා 23

රූපය 02-14: වන ව්‍යාප්ති හා දැනුවත් කිරීම් 27

රූපය 02-15: බීජ පැළ නිෂ්පාදනය 29

රූපය 02-16: නව ගොවි වන වගා ස්ථාපනය හා ගොවි වන වගා නඩත්තු කිරීම 30

රූපය 02-17: නැවත වන වගා කිරීම 36

රූපය 02.18 පයිනස් වන වගා වලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම 36

රූපය 02.19 නැවත වන වගා කිරීම සඳහා බීජ පැළ නිෂ්පාදනය 39

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1: හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම කාර්යභාරය සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2022 වර්ෂය තුළ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති පරිදි පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

- සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රශස්ථ වන ආවරණයක් පවත්වා ගැනීම.
- රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා නිෂ්පාදන වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.
- ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- රජයේත්, ප්‍රජාවගේත්, පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් තුරු වැස්ම ඉහළ නැංවීම.
- පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු ව්‍යාප්ත කිරීම.
- පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
- වන නිෂ්පාදන හා සේවාවන් තිරසාර ලෙස භාවිතය හා කළමනාකරණය කිරීම.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 13ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් (i) සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති (ii) වන විද්‍යා සහ වන වගා කළමනාකරණ (iii) භූ විද්‍යා තොරතුරු හා වන සංගණන (iv) පරිසර කළමනාකරණ හා භූ සම්පත් (v) පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු (vi) වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම (vii) සැලසුම් හා ප්‍රගති පාලන (viii) පාරිසරික සංචාරක (ix) ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ (x) ප්‍රවාහන අංශය (xi) මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන (xii) මුදල් අංශය (xiii) අභ්‍යන්තර විගණන යන අංශ ඒ යටතට ගැනේ.

මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මඟින් විස්තර කෙරේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ,

මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්ක වල පිහිටි දිසා වන කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු කොළඹ, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය සහ කිළිනොච්චිය යන දිස්ත්‍රික්ක වල ස්ථාපනය කර ඇති කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී සිදු කරයි. පර්යේෂණ කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථාන වල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන වල අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ සිදු කෙරේ.

1.2: ආයතනයේ දැක්ම, මෙහෙවර

දැක්ම

රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වැඩී එන ඉල්ලුම සපුරාලීම මෙන් ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමණාකරණය කිරීම

මෙහෙවර


ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම

1.3: ප්‍රධාන කාර්යයන්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- මනා දේශගුණික තත්ත්වයන් මෙන් ම පස, ජල සම්පත්, සතුන් හා වෘක්ෂලතා සංරක්ෂණය හා රටෙහි සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක හා සමාජ ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන ආවරණයක් දිවයිනෙහි පවත්වාගෙන යාම.
- වනබිම් සතු භූමි ලක්ෂණ, වන සතුන් හා වෘක්ෂලතා, ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, පාරිසරික හා සමාජීය ලක්ෂණ සැලකීමට ගත් ඒකාබද්ධ භූමි පරිශීලනය මඟින් වන බිම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.
- වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය සඳහා මෙන් ම අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමඟින් පාංශු හා ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම.
- අනාගත දැව අවශ්‍යතා අඛණ්ඩව සපුරා ගැනීම උදෙසා වන සම්පත් විද්‍යාත්මක පදනම්න් කළමනාකරණය කිරීම සහ ඒවායේ තිරසාර සංවර්ධනය සහතික කිරීම.
- වන සම්පත් තිරසාර සංවර්ධනයට ලක් කිරීම සඳහා අවශ්‍ය වන, වන විද්‍යා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.
- වන සම්පත් සංවර්ධනය උදෙසා දායකවන්නා වූ අනෙකුත් ආයතන සමඟ වෘත්තීය මට්ටමින් සම්බන්ධතා පවත්වාගෙන යාම.
- ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම උදෙසා වන සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය ඉලක්ක කොටගත් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ අවබෝධය හා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම.
- තත්කාලීනව බලපවත්නා වන සංරක්ෂණ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව වන සම්පත් ආරක්ෂා කිරීම.
- ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම.
- පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් වන සංවර්ධන ක්‍රියාවලීන් ප්‍රවර්ධනයට පියවර ගැනීම.

1.4: සංවිධාන සටහන


වන. සං. ජ.
අති වන.සං.ජ.(මෙහෙයුම්)
අති වන.සං.ජ.(අධ්‍යාපන)
අති වන.සං.ජ.(පරිපාලන)
වන සං (ව. ආ. නි.ක්‍රි..)
වන සං (පරි.ක.භූ. ස)
වන සං (ව. වි. ව. ව)
වන සං (ස. ව. වි. ව්‍ය)
වන සං (සැ.භා.ප්‍ර.පා)
වන සං (පා.ස)
වන සං (ජෛ වි ජ සං)
වන සං (භූ වි නෝ)
වන සං (පර්යේෂණ
වන සං (අ. ධා. සං)
වන සං (පි.පා)
ප්‍ර.ග
ප්‍ර.අ.වි.
නි.ව.සං.-කලාප (05)
නි.ව.සං. (02)
නි.ව.සං. (01
ග-II - 01
නි.නි.
ස.ව.සං
ස.ව.සං/දි.ව.නි.(23)
ගණකාධි. III
ස.ව.සං
ස.ව.සං
ස.ව.සං
වි.ව.පා.
පරි. නි
පරි. නි
පරි. නි
භාෂා පරි.
සං.නි
ව.පා.
සං.නි
සං.නි
සං.නි
ක.සේ.නී.
අ.ව.නි.
සැ.ශි.
පුස්තකාලාධි.
ක.සේ.නී.
ක.සේ.නී.
ක.සේ.නී.
ක.සේ.නී.
බී .ව.නි
ව.ව්‍යා.නි
වන.ක්.ස
ව.ගා.ක./ කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස

කෙටි යෙදුම්

වන.සං.ජ	-	වන සංරක්ෂක ජනරාල්
අති.ව.සං.ජ (මෙහෙයුම්)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ)
අති.ව.සං.ජ (අධ්‍යාපන)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (අධ්‍යාපන,පර්යේෂණ හා පුහුණු)
අති.ව.සං.ජ (පරිපාලන)	-	අතිරේක වන සංරක්ෂක ජනරාල් (මානව සම්පත් කළමනාකරණ, පරිපාලන හා ආයතන සංවර්ධන)
වන.සං (පරි.ක.භූ.ස)	-	වන සංරක්ෂක (පරිසර කළමණාකරණ හා භූ සම්පත්)
වන.සං (සැ.ප්‍ර.පා)	-	වන සංරක්ෂක (සැලසුම් හා ප්‍රගති පාලන)
වන.සං (ව.වි.ව.ව.ක)	-	වන සංරක්ෂක (වන විද්‍යා හා වන වගා කළමනාකරණ)
වන.සං (ස.ව.වි.ව.ව්‍යා)	-	වන සංරක්ෂක (සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති)
වන.සං (ව.ආ.නී. ක්‍රි).	-	වන සංරක්ෂක (වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම)
වන.සං (පා.ස)	-	වන සංරක්ෂක (පාරිසරික සංචාරක)
වන.සං (ජෛ.වි.ජ.සං)	-	වන සංරක්ෂක (ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ)
වන.සං (භූ.වි.තො.වන.සං)	-	වන සංරක්ෂක (භූ විද්‍යා තොරතුරු හා වන සංගණන)
වන.සං (පර්යේෂණ)	-	වන සංරක්ෂක (පර්යේෂණ)
වන.සං (අ.ධා.සං)	-	වන සංරක්ෂක (අධ්‍යාපන හා ධාරිතා සංවර්ධන)
වන.සං - (පි.පා)	-	වන සංරක්ෂක (පිරිස් හා පාලන)
ප්‍ර.ග	-	ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක
නී.නි	-	නීති නිළධාරී
නි.ව.ස	-	නියෝජ්‍ය වන සංරක්ෂක
ගණකාධි. - ii	-	ගණකාධිකාරී
ස.ව.සං.	-	සහකාර වන සංරක්ෂක
ගණකාධි. - iii	-	ගණකාධිකාරී
පරි.නි	-	පරිපාලන නිළධාරී
වි.ව.පා	-	විශේෂ වන පාලක
භාෂා පරි.	-	භාෂා පරිවර්තක
සං.නි	-	සංවර්ධන නිලධාරී
ක.සේ.නි	-	කළමනාකරණ සේවා නිලධාරී
අ.ව.නි	-	අඩවි වන නිලධාරී
පුස්තකාලාධි.		පුස්තකාලාධිපති
සැ.ශි	-	සැලසුම් ශිල්පී
බී.ව.නි	-	බීට්ටු වන නිලධාරී
ව.ව්‍යා.නි	-	වන ව්‍යාප්ති නිලධාරී
ව.ක්.ස	-	වන ක්ෂේත්‍ර සහකාර
ව.ගා.ක	-	වගා කම්කරු
කා.කා.ස	-	කාර්යාල කාර්ය සහයක

1.5: දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ 13 යටතේ පාලනය වේ.

1.5.1: සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය

ජාතික මට්ටමේ වන ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන් ම සියලු ම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩසටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, වන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා බීජ පැළ නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ ප්‍රජාව සඳහා නියමු මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනා දී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම ද පැවරී තිබේ. ස්වාභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතු වල වගකීම ද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය. තව ද අයවැය යෝජනා මත වන ඝණත්වය වැඩි කිරීම සඳහා ලබා දුන් විශේෂ මුදල් ප්‍රතිපාදන යටතේ විශේෂ වන වගා ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් රැසක් ද මෙම අංශය යටතේ පාලනය කරනු ලැබේ.

1.5.2: පරිසර කළමනාකරණ හා භූ සම්පත් අංශය

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියලු පරිසර පද්ධතීන්හි ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. තව ද වනාන්තර කළමනාකරණ සැලසුම් සකස් කිරීම, භූ සම්පත් සමීක්ෂණය හා තිරසාර භාවිතය සඳහා වූ සැලසුම් සකස් කිරීම ද මෙම අංශය යටතට ගැනේ.

1.5.3: වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන් ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත් ද, සුරැකීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ නීතිමය පසුබිම සැකසීම වේ. එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීම, ප්‍රාදේශීය කාර්ය මණ්ඩල හදිසි වැටලීම් අංශය සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම මෙන් ම ආරක්ෂිත ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රකාශයට පත් කිරීම සහ වන සංරක්ෂණ අඥා පනත සඳහා නියෝග සකස්කිරීම ද මෙම අංශය සතු වගකීම් වේ.

1.5.4: භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය

භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය ප්‍රධාන වශයෙන් රටේ වන සම්පත් ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ පවතින වනාන්තර මිනුම් කිරීම සහ සිතියම් සැකසීම, වනාන්තරවල මායිම් සලකුණු කිරීම, ස්වාභාවික සහ ස්ථාපිත වනාන්තරවල සංගණනයන් සිදු කිරීම, වන වගාවන් වල සංගණන දත්ත අඩංගු දත්ත සමුදාය පවත්වාගෙන යාම, වන ආවරණ සිතියම් සැකසීම, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් වලට අවශ්‍ය අංකිත සිතියම් සැකසීම, වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය උපලේඛන සැකසීම හා ඒවා පරීක්ෂා කිරීම වේ. තව ද පැරණි ගුවන් ඡායාරූප, අංකිත දත්ත, භූ සිතියම්, ගුවන් ඡායාරූප ලබාගත් රේඛාවන් දක්වන භූ සිතියම් ආරක්ෂිතව ගබඩා කර තැබීම ද මෙම අංශයේ වගකීමක් වේ.

1.5.5: සැලසුම් හා ප්‍රගති පාලන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම මෙන් ම ගොඩනැගිලි ඉදි කිරීම, අධීක්ෂණය සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ දියුණු කිරීම යන ක්‍රියාකාරකම් ද සැලසුම් හා ප්‍රගති පාලන අංශය විසින් සිදු කරනු ලැබේ.

1.5.6: පාරිසරික සංචාරක අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් හි ප්‍රමුඛතම අංශයක් වන සංචාරක කර්මාන්තයට ඉහළ දායකත්වයක් ලබාදිය හැකිවන්නා වූ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන්නා වූ ස්වභාවික වනාන්තර ආශ්‍රිතව ඉතා ඉහළ විභවයක් ඇත. තව ද පාරිසරික සංචාරක කර්මාන්තය මඟින් වනාන්තර ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඇති ඉහළ විභවය නිසි පරිදි කළමනාකරණය කර ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා ද පාරිසරික සංචාරක කර්මාන්තය යොදා ගැනීමට හැකියාව තිබේ.

පාරිසරික සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් සහ සංචාරකයින් සමඟ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ද යොදාගැනීමට හැකියාව ඇත. මේ සඳහා සංචාරකයින්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන එම අවශ්‍යතා සැපයීමට දෙස් විදෙස් සංචාරකයින් විශාල ලෙස ආකර්ශණය කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, පරිසර පද්ධති සංරක්ෂණය තහවුරු කර ගනිමින්, ප්‍රජාවගේ සුභ

සිද්ධිය සැලසීම සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා පාරිසරික සංචාරක ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ වගකීම වේ.

1.5.7: වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශය

දැව නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් තිරසාර ලෙස වන වගා කළමනාකරණය කිරීම වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. වන වගා ස්ථාපනය කිරීම හා කළමනාකරණය, අස්වනු නෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත වන වගා නිදහස් කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම අංශය දායක වේ. පයිනස් වගා බිම්වලින් පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් රෙසින් නිස්සාරණය කිරීම සහ පුද්ගලික අංශය සමග නැවත වගා කිරීමේ කටයුතුවල නිරත වීම මෙම අංශයේ අනෙකුත් වගකීම් වේ.

1.5.8: ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශය

ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශයේ අරමුණ වනුයේ ජෛව විවිධත්වය, පස, ජලය කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමය. වන ආවරණය වැඩි කිරීම හා සංරක්ෂණය කිරීම, වන ආවරණය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම, ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගනිමින් වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කඩොලාන නැවත වගා කිරීම හා පවතින කඩොලාන පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වැව් තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම යනාදී ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

1.5.9: පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු අංශය

පර්යේෂණ, අධ්‍යාපන සහ පුහුණු අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුළ, පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.

මේ යටතේ පර්යේෂණ අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලින් ද, අධ්‍යාපන අංශය, නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය යන අංශ මඟින් ද පාලනය වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ද මෙම අංශය යටතේ පවතී. මේ වන විට පුස්තකාලය සතුව ග්‍රන්ථ *7685ක් පමණ ද, වාර්තා 1050ක් පමණ ද ඇති අතර වාර්ෂිකව මුද්‍රණය කරනු ලබන විද්‍යාත්මක සඟරා 30ක් පමණ එකතුවක් පවතී.
(*පරිග්‍රහණ ලේඛනයේ අවසාන අංකයට අනුව පොත් සංඛ්‍යාව 32,000ක් ලෙස මින් පෙර සඳහන්ව ඇතත් එහි ආරම්භක අංකය 24,021 බැවින් සත්‍ය වශයෙන් ඇති පොත් සංඛ්‍යාව 7,685කි.)

වන විද්‍යා පර්යේෂණ ආයතනය මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩසටහන, පර්යේෂණ මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරණය කිරීමෙහිලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින් සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යා සම්බන්ධ ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් (NVQ 5 සහ 6 මට්ටමේ) ආශ්‍රිත පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් සිදු කරනු ලබයි. තව ද පුද්ගලික අංශයෙන් සහ රජයේ වෙනත් නියෝජිත ආයතනවලින් සිදුකරන ඉල්ලීම්වලට අනුව කෙටි කාලීන පුහුණු වැඩසටහන් සිදුකරනු ලැබේ. දඹුල්ල ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමණාකරණ ව්‍යාපෘතියේ ආධාර යටතේ අළුතින් ඉදිකර ඇත.

1.5.10: ප්‍රවාහන අංශය

මෙම අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, සංචිතයේ තිබෙන වාහන වලට සහ නිලධාරින්ට වෙන් කරන ලද වාහන වලට ඉන්ධන සැපයීම සහ රියදුරන්ගේ අතිකාල, අමතර ප්‍රවාහන ඉන්ධන ඉල්ලීම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම යනාදී කටයුතු සඳහා වගකියනු ලැබේ. මෙයට අමතරව, ප්‍රධාන කාර්යාලයට හා අනෙකුත් ක්ෂේත්‍ර කාර්යාලවලට අයත් වාහන ගර්හිත කිරීම, අළුත්වැඩියා කටයුතු සඳහා සහ ඉන්ධන සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයීම ද ප්‍රධාන කාර්යාලයේ වාහන සේවා කිරීමේ කටයුතු හා රක්ෂණය කිරීමේ කටයුතු ද, සියලුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍ර කාර්යාලවල වාහන වල සිදු වන අනතුරු සම්බන්ධව කටයුතු කිරීම ද මෙම අංශය මඟින් සිදු වේ

1.5.11: මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. එමෙන් ම මහජනයාට උපරිම සේවාවක් සැපයීම උදෙසා පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුළ තම සේවාව මනාව ඉටු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිසා වන කාර්යාල, අඩවි වන කාර්යාල, වන විද්‍යාලය හා පර්යේෂණ මධ්‍යස්ථාන වල සේවයේ නියුතු මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

පිරිස් හා පාලන යන විෂයයන්ට අදාළ කටයුතු මෙම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ විධි විධාන සහ අදාළ නීති, රෙගුලාසි සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුළත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වලට අනුකූලව සියලු බඳවා ගැනීම්, උසස් වීම් හා අනෙකුත් වරප්‍රසාද ලබා දීම් සිදු කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කෙරේ.

1.5.12: මුදල් අංශය

දෙපාර්තමේන්තුවට අදාළ මූල්‍යමය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල් අංශය මඟිනි. මෙම අංශය මහා භාණ්ඩාගාරය, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැලසුම් කිරීම, මෙහෙයවීම, පාලනය හා ගිණුම් තැබීම, මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් සහ දෙපාර්තමේන්තු ආදායම් සම්බන්ධ මූල්‍ය පාලනය, මහා භාණ්ඩාගාරයට සහ දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය මූල්‍යමය තොරතුරු වර්ගීකරණය කර ඉදිරිපත් කිරීම, විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සහ දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින කැළෑ ගිණුම් සම්බන්ධ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.5.13: අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ VII වන කොටසේ 40 වන වගන්තිය මෙන්ම, මුදල් රෙගුලාසි සංග්‍රහයේ වගන්ති අංක 133,134 හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව ඉටු කරනු ලබන රාජකාරි කටයුතු පිළිබඳ තොරතුරු වන සංරක්ෂණ ජනරාල් වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.

දෙපාර්තමේන්තු කාර්යයන්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව සිදුවේ ද යන්න පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම තුලින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහල නංවා ගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන විධිවල ප්‍රමාණාත්මකභාවය ඇගයීමකට ලක් කොට එහි තත්ත්වයන් පිළිබඳ වන සංරක්ෂක ජනරාල් වෙත වාර්තා කිරීම සිදු කරයි.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1: ලබාගන්නා ලද ප්‍රගතිය

වන සංරක්ෂණය හා සංවර්ධනය මූලික කරගත් කාර්යයන් සමුදායක් 2022 වසර තුළ දියත් කළ අතර ඒවායේ කාර්යසාධනය පහත අංශ ඔස්සේ විස්තර කෙරේ.

2.1.1: වන ආවරණය ඉහළ නැංවීම

විවිධ හේතූන් මත හායනයට පත් ස්වභාවික වනාන්තර වල ගුණාත්මය වැඩිකිරීමේ අරමුණින් ස්වභාවික පුනර්ජනනය වැඩිකිරීම මඟින් හෙක්.188ක් වනාන්තර ප්‍රතිස්ථාපනයට කටයුතු කිරීම ආරම්භ කරන ලදී. තව ද පසුගිය වසර 03ක් තුළ එසේ ප්‍රතිස්ථාපනය ආරම්භ කරන ලද වනාන්තර බිම් හෙක්.7758.16ක් නඩත්තු කර පවත්වාගෙන යන ලදී.

ANR වැඩසටහන්, වනාන්තර ප්‍රතිස්ථාපන වැඩසටහන්, වැව් තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, කටුපඳුරු සහිත ඉඩම් වනාන්තර බවට පත් කිරීම, අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීම, රණවිරු රුක්රෝපණය යන විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ සිදු කරන ලදී.

ජල පෝෂක ප්‍රදේශ ලෙස වැදගත් වන හායනයට පත් කඳු මුදුන් මත හෙක්.30ක වන වගා ස්ථාපනය කරන ලද අතර පසුගිය වසර වල ප්‍රතිස්ථාපනය කරන ලද කඳු මුදුන් වන වගා හෙක්.56.4ක නඩත්තු කටයුතු සිදු කරන ලදි. විශේෂ අයවැය යෝජනා වැඩසටහන යටතේ 2021 වර්ෂයේ දී හායනයට පත් භූමිවල ස්ථාපිත කරන ලද වාණිජ වන වගා හෙක්.883.5ක පළමු වසර නඩත්තුව සිදු කරන ලදි.

2030 වන විට ශ්‍රී ලංකාවේ වන වැස්ම 32%ක් දක්වා වැඩි කිරීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ආරක්ෂක අංශවල සහය ද ලබා ගනිමින් හායනයට පත් වත්තේගම කැබිලිත්ත රක්ෂිතයේ හෙක්.1033.6ක පැළ 191,654ක ප්‍රමාණයක් සිටුවා රක්ෂිත ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට කටයුතු සිදු කරන ලදී.




රූපය 02-1: වන ආවරණය ඉහළ නැංවීම

2.1.2: කඩොලාන සංවර්ධන වැඩසටහන්

අම්පාර, මන්නාරම, ත්‍රිකුණාමලය, පුත්තලම, මඩකලපුව, කිලිනොච්චිය, මුලතිව් හා කළුතර දිස්ත්‍රික්කයන්හි නව කඩොලාන වන වගා ස්ථාපිත කිරීම් යටතේ හෙක්.100ක කඩොලාන වන වගා ස්ථාපිත කර ඇත. තව ද හෙක්. 221.6ක කඩොලාන නඩත්තු කටයුතු කරන ලදී.

2.1.3: වන ආවරණය ඉහළ නැංවීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම

මේ වන විට පහත සඳහන් ව්‍යාපෘති සිදු කෙරෙමින් පවතී,

- NDB බැංකුව සමඟ මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 05ක වන වගා ව්‍යාපෘතිය.
- සීමාසහිත අවුට්රීච් ප්‍රොජෙක්ට් (ලිමිටඩ්) සමඟ මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 05ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.
- ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමඟ එක්ව රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්. 6.6ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.

පහත සඳහන් ව්‍යාපෘති 2022 වසරේ දී ආරම්භ කරන ලදී.

- කොමර්ෂල් බැංකුව සමඟ වන වගා ව්‍යාපෘතිය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හෙක්. 100ක්.
- IUCN සමඟ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය හෙක්. 25ක්.

2.1.4: කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ක්ෂේත්‍රයේ සියලුම නිලධාරීන්ගේ සහාය ඇතිව දිවයින පුරා කැළෑ ගිනි පාලනය කිරීමේ වැඩසටහන් 70ක් පවත්වන ලදී. මීට අමතරව, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් 120ක් පැවැත්වීම , කි.මී.184ක ගිනි පටි කැපීම, පෝස්ටර් සහ බැනර් ප්‍රචාරණ කටයුතු 1000, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් නිවේදන නිකුත් කිරීම, ශ්‍රමදාන, ප්‍රචාරණ කටයුතු සහ ගිනි පාලනය කිරීම සඳහා සිනුව සහිත හෙලිකොප්ටර් සහ කම්කරුවන් යොදා ගැනීම, ගිනි නිවීමේ උපකරණ කට්ටල 20ක් මිලදී ගැනීම හා අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

2.1.5: වැව් තාවුළු සංරක්ෂණය

අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව, හම්බන්තොට දිස්ත්‍රික්කවල හෙක්.100.3ක තෝරාගත් වැව්වල දේශීය පැළ සිටුවා හෙක්. 94.7ක වැව් වෘක්ෂලතා සංරක්ෂණය හා නඩත්තුව සඳහා කටයුතු සිදු කරන ලදී.

2.1.6: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022

වගුව 02-1: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022

කාර්යය	ඉලක්ක-2022 භෞතික (හෙක්.)	ඉලක්කය -2022 මූල්‍ය (රු.)
ස්වභාවික වනාන්තර ප්‍රතිස්ථාපනය	105	2,801,849.00
කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	ඉහත සඳහන් කර ඇත	10,929,447.50
ලබා දුන් ප්‍රතිපාදන එකතුව		**13,731,296.50**

2.1.7: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022 - නඩත්තු

වගුව 02-2: දෙපාර්තමේන්තු වැඩසටහන - 2022- නඩත්තු

කාර්යය	ඉලක්ක-2022 භෞතික (හෙක්.)	ඉලක්කය -2022 මූල්‍ය (රු.)
ස්වභාවික වනාන්තර නඩත්තු (ANR Maintain)	3960.2	113,100,840.00
ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු (Restoration Maintain)	306.46	16,768,300.00
රණවිරුවන්ගේ සහයෝගයෙන් වනාන්තර නඩත්තු	47	6,998,000.00
ප්‍රතිස්ථාපිත කඩොලාන නඩත්තුව	102.6	2,102,460.00
ලබා දුන් ප්‍රතිපාදන එකතුව		**138,969,600.00**

2022 වර්ෂයේ ප්‍රතිපාදන අත්හිටුවීම් යටතේ අඩු කරන ලද ප්‍රතිපාදන රු.1,600,000.00කි. ඒ අනුව සත්‍ය වශයෙන් නිකුත් කර ඇති ප්‍රතිපාදන	(152,700,896.50 - 1,600,000.00)	151,100,896.50

2.1.8: මිලියන 3500 විශේෂ වැඩසටහන

මේ යටතේ ද පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා නඩත්තු කටයුතුද සිදු කරන ලදී. ඒ සඳහා පහත සඳහන් කර ඇති පරිදි ප්‍රතිපාදන වෙන් කරන ලදී.

වගුව 02-3: මිලියන 3500 විශේෂ වැඩසටහන - 2022

කාර්යය	ඉලක්ක-2022 භෞතික (හෙක්.)	ඉලක්කය -2022 මූල්‍ය (රු.)
කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීම.	100	7,340,000.00
වැව් තාවුළු වල වන වගා කිරීම.	100.3	1,000,000.00
ආගමික ස්ථාන වල රුක් රෝපණය. (අනුරාධපුර මහමෙව්නා උයන)	4	1,500,000.00
ආක්‍රමණශීලී ශාක ඉවත් කර වන වගා කිරීම.	80	500,000.00
2022 වර්ෂය සඳහා ලබා දුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය		**10,340,000.00**

වගුව 02-4: මිලියන 3500 විශේෂ වැඩසටහන -2022

කාර්යය	ඉලක්ක-2022 භෞතික (හෙක්.)	ඉලක්කය -2022 මූල්‍ය (රු.)
ස්වභාවික වනාන්තර පුනර්ජනනය නඩත්තු. (ANR Maintain)	100	3,000,000.00
කටු පදුරු සහිත ඉඩම් වල ස්ථාපිත කල වන වගා නඩත්තු කිරීම	622.32	24,816,509.91
අත්හරින ලද ගෙවතු වල ස්ථාපිත කරන ලද වනාන්තර නඩත්තු කිරීම.	130	4,000,000.00
ප්‍රතිස්ථාපිත කඩොලාන වනාන්තර නඩත්තු කිරීම.	119	6,000,000.00
වැව් තාවුළු වල වගා කරන ලද වන වගා නඩත්තු	94.7	3,000,000.00
ආක්‍රමණශීලී ශාක ඉවත් කරන ලද වනාන්තර නඩත්තු කිරීම.	100	9,000,000.00
2022 වර්ෂය සඳහා ලබා දුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය		**49,816,509.9**

2.1.9: පාරිසරික සංචාරක කටයුතු ක්‍රියාත්මක කිරීම

2.1.9.1: ලෝක උරුම වන භූමීන් නඩත්තුව හා කළමනාකරණය

සිංහරාජ, නකල්ස් ලෝක උරුම වන භූමීන් ගේ පවත්වාගෙන යනු ලබන ස්වාභාවික මංපෙත්, ප්‍රවේශ පත්‍ර කවුළු ඇතුළු සියලු පහසුකම් නඩත්තු කරමින් පවත්වාගෙන යාම. මෙම ලෝක උරුම වන භූමීන් නැරඹීමට පැමිණෙන පාසල් සිසුන් ඇතුළු සියලු කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් හා මාර්ගෝපදේශ පහසුකම් සැපයීම.

- නකල්ස් ලෝක උරුම වන භූමියේ රත්න ඇල්ල තෙක් දිවෙන මාර්ගයේ ඇති ගමන් කිරීම අපහසු ස්ථාන 2ක් කොන්ක්‍රීට් කණු ඉදි කර විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කරන ලදී.



රූපය 02-2: රත්න ඇල්ල තෙක් මාර්ගය කොන්ක්‍රීට් කණු ඉදිකර විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම

- සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ආදර්ශ මොඩියුලය නවීකරණය කිරීම



රූපය 02-3: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ආදර්ශ මොඩියුලය නවීකරණය කිරීම

- සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අදාළ REEC මධ්‍යස්ථානයේ (විහඟ කැදැල්ල) කබානා ගොඩනැගිල්ල සඳහා තිරරෙදි සවි කිරීම.



රූපය 02-4: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අදාල REEC මධ්‍යස්ථානයේ කබානා ගොඩනැගිල්ල සඳහා තිරරෙදි සවිකිරීම

- සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය සඳහා කොට්ට උර ඇඳ ඇතිරිලි සහ ඇඳන් සඳහා ඇඳ ලැලි යොදා නවීකරණ කටයුතු සිදු කිරීම.



රූපය 02-5: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය සඳහා ඇඳ ඇතිරිලි හා ඇඳ ලැලි යොදා නවීකරණය කිරීම

2.1.9.2: පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය

- උඩවත්ත කැළේ, කුරුළු කැළේ සහ මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානවල අවශ්‍ය පහසුකම් නඩත්තු හා වැඩි දියුණු කිරීම් සිදු කරමින් පවත්වාගෙන යාම.
- උඩවත්ත කැළේ සෝදා යාම නිසා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති කොටසේ පැති බැම්මක් ඉදි කිරීම.
- කුරුළු උයන ප්‍රධාන ගොඩනැගිල්ල ආශ්‍රිතව මාර්ගය පිඩලි අල්ලා භූමිය සකස් කිරීම සහ ගේට්ටුව ඉදි කිරීම




රූපය 02-6: කුරුළු උයන ප්‍රධාන ගොඩනැගිල්ල ආශ්‍රිතව මාර්ගය පිඩලි ඇල්ලීම හා ගේට්ටුව ඉදි කිරීම

- මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ස්වාභාවික මංපෙත් නඩත්තු කිරීම හා කුරුළු නැරඹුම් මධ්‍යස්ථානය සකස් කිරීම.





රූපය 02-7: මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ස්වාභාවික මංපෙත් නඩත්තුව හා කුරුළු නැරඹුම් මධ්‍යස්ථානය සකස් කිරීම

- මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය සකස් කිරීම හා වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම



රූපය 02-8: මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය සැකසීම හා වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම

- සංචාරකයින්ගේ සහ නිලධාරීන්ගේ වැසිකිලි නවීකරණය කිරීම



රූපය 02-9: සංචාරකයින්ගේ සහ නිලධාරීන්ගේ වැසිකිලි නවීකරණය කිරීම

- මාකන්දාව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ගිමන් නිවීම සඳහා කොන්ක්‍රීට් බංකු ස්ථාපිත කිරීම

2.1.9.3: පාරිසරික උද්‍යාන නඩත්තුව සහ සංවර්ධනය

- ගල්ඔය යෝජිත පාරිසරික උද්‍යානයේ සඟාරි ජීප් රථ මාර්ගයේ මුදුන් ඇළ සිට අඹගස් වැව තුන්මන් හන්දිය දක්වා කි.මී.02ක ප්‍රමාණයක් වැඩි දියුණු කිරීම.



රූපය 02-10: ගල්ඔය පාරිසරික උද්‍යානයේ සඟාරි ජීප් රථ මාර්ගයේ කි.මී.02ක ප්‍රමාණයක් වැඩි දියුණු කිරීම



රූපය 02-11: ගල්ඔය පාරිසරික උද්‍යානයේ සඟාරි ජීප් රථ මාර්ගයේ කි.මී.02ක ප්‍රමාණයක වැඩි දියුණු කල කොටසේ කොන්ක්‍රීට් කෝසු ස්ථාපිත කිරීම

- ගල්ඔය පාරිසරික උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතියේ අඹගස්වැව තුන්මන් හන්දියේ සිට ප්‍රධාන පිවිසුම් මාර්ගය දක්වා කි.මී.4.5ක ප්‍රමාණයක් වැඩි දියුණු කිරීම.
- ගල්ඔය පාරිසරික උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල භූමි අලංකරණය සඳහා පවතින ගස් වටා අසුන් ඉදි කිරීම හා පිවිසුමේ සිට කාර්යාලය දක්වා පවතින මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීම.
- හුරුළු පාරිසරික උද්‍යානය නඩත්තු කටයුතු සහ වැඩි දියුණු කිරීම් සිදු කිරීම.
  - ❖ හුරුළු පාරිසරික වන උද්‍යානයේ පිහිටි අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කි.මී.12ක දුරක් නඩත්තු කිරීම. (බොරළු යොදා, වලවල් වසා මාර්ග පවිත්‍ර කිරීම.)
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ පිවිසුම් දොරටුව සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලාංඡනය (විෂ්කම්භය3.5') හා "වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව" අකුරු පුවරුව සකස් කිරීම.
- හුරුළු පාරිසරික වන උද්‍යානයේ ප්‍රධාන පිවිසුමේ උඩු මහලේ වහලය ඉදිරිපස වඩිම්බු යොදා අලුත්වැඩියා කිරීම.

2.1.9.4: කඳවුරු භූමි නඩත්තුව සහ සංවර්ධනය කිරීම

- දෝතළුගල, ඔහිය, එක්ගල් ඔය සහ හිරිකටු ඔය යන කඳවුරු භූමි නඩත්තු කරමින් වැඩි දියුණු කිරීම් සිදු කිරීම.
  - ❖ හිරිකටු ඔය අධ්‍යාපන හා තොරතුරු මධ්‍යස්ථානයේ මාර්ගය සකස් කිරීම, මිදුල සකස් කිරීම, ජල හා විදුලි පද්ධති සකස් කිරීම ඇතුළු සුළු අළුත්වැඩියාවන් සිදු කිරීම.
  - ❖ බදුල්ල ඔහිය ප්‍රදේශයේ ලැගුම්හලක් ඉදිකිරීම.

2.1.9.5: ප්‍රවේශ පත්‍ර කවුළු ස්ථාපනය

- පිටදෙනිය වතුගල ප්‍රවේශ පත්‍ර කවුළුව ස්ථාපිත කිරීම.

සිංහරාජ වනාන්තරයේ කැකුණ ඇල්ල, පතන් ඇල්ල හා මල්මොර ඇල්ල නැරඹීම සඳහා නෙළුව ලංකාගම මාර්ගයෙන් පැමිණෙන නරඹන්නන් හට ඇතුල්වීම සඳහා ප්‍රවේශපත්‍ර කාර්යාලයක් නොතිබිණි. එබැවින් වතුගල නව ප්‍රවේශපත්‍ර කාර්යාලයක් විවෘත කිරීම සිදු කෙරුණි.



රූපය 02-12: පිටදෙනිය වතුගල ප්‍රවේශපත්‍ර කවුළුව ස්ථාපිත කිරීම

2.1.9.6: පාරිසරික සංචාරක අංශයේ 2022 වසරේ ආදායම

ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන ආදායම

වනාන්තර තුළ රූපගත කිරීමෙන් ලද ආදායම - රු. 1,061, 492.42

වනාන්තර නැරඹීම් සඳහා ලැබුණු ආදායම - රු. 17,119.91

ප්‍රාදේශීය කාර්යාලවලින් ලැබෙන ආදායම

ආදායම - රු.94,076,039.92

සංචාරකයින් ප්‍රමාණය - 276, 735

පාරිසරික සංචාරක බංගලා වෙතින් ලැබෙන ආදායම

ආදායම - රු.7,392,214.67

සංචාරකයින් ප්‍රමාණය - 11, 900

වගුව 02-5: ප්‍රාදේශීය කාර්යාල වලින් ලැබෙන සංචාරක ආදායම් හා සංචාරක පැමිණීම් තොරතුරු (2022.01.01 සිට 2022.12.31 දිනට)

ආයතනය /ජාතික උද්‍යානය /වනාන්තර	සංචාරක පැමිණීම			ආදායම (රු.)			
	ප්‍රාදේශීය	විදේශීය	එකතුව	ප්‍රාදේශීය	විදේශීය	වෙනත්	එකතුව
මාකන්දාව (කෑගල්ල)	935	187	1,122	39,755.33	144,749.64	0	184,504.97
නුවරගල (අම්පාර)	1,467	17	1,484	207,490.45	11,900.00	0	219,390.45
කොට්ටව (ගාල්ල)	1,178	58	1,236	54,087.46	45,084.00	0	99,171.46
කන්නෙලිය (ගාල්ල)	25,730	1,169	26,899	1,803,399.53	1,015,694.63	0	2,819,094.16
හුරුළු පාරිසරික උද්‍යානය (පොළොන්නරුව)	40,574	43,850	84,424	4,380,638.81	57,542,953.02	10,947,683.11	72,871,274.94
සිංහරාජය (මාතර)	24,749	4,635	29,384	1,760,744.00	3,952,781.40	0	5,713,525.40
සිංහරාජය (රත්නපුර)	9,730	1,780	11,510	614,261.47	1,460,463.55	0	2,074,725.02
රත්න ඇල්ල (මහනුවර)	4,181	219	4,400	230,851.13	105,674.36	0	336,525.49

උඩවත්ත කැළේ (මහනුවර)	16,780	3,993	20,773	1,316,415.78	1,578,445.28	24,656.48	2,912,517.54
නකල්ස් (මහනුවර)	3,245	826	4,071	140,103.74	567,150.36	32,363.88	739,617.98
නකල්ස් (මාතලේ)	78,414	582	78,996	3,696,853.68	425,138.78	100,510.31	4,222,502.77
මන්දාරම්නුවර (නුවරඑළිය)	6,123	11	6,134	454,733.88	6,620.35	0	461,354.23
පිදුරුතලාගල (නුවරඑළිය)	2,652	0	2,652	147,516.16	0	1,100,940.90	1,248,457.06
බඩගමුව (කුරුණෑගල)	1,924	2	1,926	47,763.67	300	0	48,063.67
කුරුලුකැළේ (කෑගල්ල)	1037	0	1037	38,904.78	0	0	38,904.78
ගල්විල පරිසර උද්‍යානය (පුත්තලම)	131	2	133	13,470.00	290	17,250.00	31,010.00
දොලුකන්ද (කුරුණෑගල	554	0	554	55,400.00	0	0	55,400.00
එකතුව	**219,404**	**57,331**	**276,735**	**15,002,389.87**	**66,857,245.37**	**12,223,404.68**	**94,076,039.92**

වගුව 02-6: සංචාරක බංගලා වෙත පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව හා ආදායම

	සංචාරක බංගලා වල නම්	**සංචාරකයින් ප්‍රමාණය**	**ආදායම (රු.)**
01	දුම්බර වන නිවහන (මාතලේ)	2,102	753,011.03
02	ඩීන්ස්ටන් සංචාරක බංගලාව (මහනුවර)	618	164,541.03
03	තෙල්ගමු ඔය වන නිවහන (මාතලේ)	755	356,363.37
04	නිදන ශාලා (කුඩව-රත්නපුර)	1,080	1,137,600.76
05	කැබින් 1,2,3 (කුඩව-රත්නපුර)	1,124	1,415,297.13
06	සිංහරාජ (මාණ්ඩලික නිලධාරි නිවස/ කුඩව - රත්නපුර)	40	9,033.00
07	පිටදෙනිය	3,528	1,425,797.76
08	ගිංගඟ(පිටදෙනිය)	258	206,985.26
09	හිරිකටු ඔය කඳවුරු බිම (බලන්ගොඩ - රත්නපුර)	491	484, 245.78
10	මෝනින් සයිඩ් (කුඩව - රක්වාන - රත්නපුර)	538	310,822.60
11	කුරුලු කබානා (කුඩව - රත්නපුර)	4	13,800.00
12	දෝතලුගල කඳවුරු බිම (මහනුවර)	132	128,469.11

13	මන්දාරම් නුවර කඳවුරු බිම (නුවරඑළිය)	10	5,750.00
14	ඔහිය කඳවුරු බිම (බදුල්ල)	56	53,768.15
15	කොස්ගුලන වන නිවහන (කුඩව - රත්නපුර)	443	226,855.00
16	RECC (කුඩව - රත්නපුර)	183	194,832.07
17	එක්ගල් ඔය (අම්පාර)	563	505,042.62
	එකතුව	**11,925**	**7,392,214.67**

2.1.10: සංචාරක බංගලාවලින් ලද ආදායම

සංචාරක බංගලා, සංරක්ෂණ මධ්‍යස්ථාන, නැරඹුම් කුටි සහ කඳවුරු බිම් මහජනයාගේ පරිහරණයට ලබා දීමෙන් රුපියල් මිලියන 1.337ක මුදලක් උපයා ගෙන තිබේ.





රූපය 02-13: සංචාරක බංගලා

වගුව 02-7:සංචාරක බංගලා වලින් ලද ආදායම

අංකය	සංචාරක බංගලා වල නම්	ආදායම (රු.)
01	අනුරාධපුර	22,711.00
02	නුවරඑළිය	
03	පට්ටිපොල	79,037.25
04	හාලිඇල	43,618.05
05	කුඹල්පොල	4,395.25
06	තණමල්විල	58,872.00
07	මින්නේරිය	33,216.75
08	නාදුගල	23,113.25
09	තඹබෝව	55,626.50
10	ඔහිය	229,640.00
11	හම්බන්තොට	11,181.00
12	මහනුවර	82,320.00
13	කතරගම	45,287.00
14	හපුතලේ	26,2941.25
15	කන්නෙලිය	-
16	ත්‍රිකුණාමලය	122,001.00
17	කන්දෙ ඇල	-
18	යාපනය	189,206.00
19	මුරකැලේවත්ත	-
20	මින්නේරිය නව	42,262.50
21	මන්නාරම	32,208.00
22	හම්බන්තොට කඳවුරු භූමිය	-
	එකතුව	**1,337,636.80**

2.1.11: පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු කටයුතු

2022 වර්ෂයේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වල ගුණාත්මකභාවය වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 08ක් නිලධාරීන් 176ක් සහභාගීත්වයෙන් පැවැත්විණි. මාර්ගගතව පැවැත්වූ විදේශීය පුහුණු පාඨමාලා 16ක් සඳහා නිලධාරීන් 163ක් යොමුකරන ලදී. වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ පුහුණු වැඩසටහන යටතේ The International Union of Forest Research organizations (IUFRO) අනුග්‍රහයෙන් නිලධාරීන් 482ක් පුහුණු කරන ලදී.

Sri Lanka Forester විද්‍යාත්මක සඟරාවේ 41 කලාපය (මාර්ගගතව) ප්‍රකාශයට පත් කිරීම සහ Forest Research Newsletter ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරී සඳහා අවශ්‍ය ලිපි ලේඛන/වාර්තා වලට අදාළව භාෂා පරිවර්තන කටයුතු 66ක් පමණ අවසන් කර ඇත.

තව ද ජාතික වන පර්යේෂණ කමිටුව මඟින් පර්යේෂණ යෝජනා 28ක් සමාලෝචනය කර පර්යේෂණ සඳහා අනුමැතිය ලබා දී ඇත. ජාතික වන පර්යේෂණ දත්තමූලය යාවත්කාලීනව

පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. පුස්තකාල දත්ත පද්ධතියක් සැකසීමට මූලික කටයුතු ආරම්භ කර ඇත. නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම හා දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් අදාළ පුහුණු සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම, පුහුණු වැඩසටහන් වල සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම සිදු කරමින් පවතී.

2.1.12: වන විද්‍යා පර්යේෂණ ආයතනය

2022 වර්ෂය තුළ දී නව පර්යේෂණ බිම් කොටස් ස්ථාපනය කිරීම සහ පැළ තවාන් ආශ්‍රිත පර්යේෂණ, දැනට ස්ථාපනය කර තිබෙන පර්යේෂණ බිම් කොටස් නඩත්තු කිරීම, ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රියාකාරකම් තවදුරටත් සිදුකිරීම සහ බීජ එක්රැස් කිරීම යන ප්‍රධාන කාණ්ඩ හතර යටතේ සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සිදුකරන ලදී. මෙයට අමතරව, අවශ්‍යතාවන්ට අනුව ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සහ දත්ත එක් රැස් කිරීමේ කටයුතු සිදුකරන ලදී. ක්ෂේත්ර පර්යේෂණ සහ නිරීක්ෂණ පදනම් කරගනිමින් පර්යේෂණ පත්‍රිකා 02ක් ප්‍රකාශයට පත්කරන ලද අතර කෙටුම්පත් 03ක් ද සකස් කර ඇත.

(1). නව පර්යේෂණ බිම් කොටස් සහ පැළ තවාන් ආශ්‍රිත පර්යේෂණ ස්ථාපිත කිරීම

- ක්ෂේත්‍ර පර්යේෂණ

(අ) ලියන් (*Homalium zeylanicum*) ආදර්ශන බිම් කොටසක් ස්ථාපනය කිරීම.

කුරුණෑගල දිසාවේ විහාරකන්ද ප්‍රදේශයේ (හෙක්.0.4) සහ මහනුවර දිසාවෙහි හතරලියද්ද ප්‍රදේශයේ (හෙක්.0.5) වශයෙන් හෙක්.0.9ක පර්යේෂණ බිම් කොටස් දෙකක් ස්ථාපනය කරන ලදී.

- පැළ තවාන්වල සිදුකරන පරීක්ෂණ

වන ශාක වල බීජ පැළ වල වර්ධනය කෙරෙහි ජෛව පටල පොහොරවල බලපෑම ඇගයීම.

- බීජ ප්‍රරෝහණය පිළිබඳ අධ්‍යයන කටයුතු

ජෑම් *(Muntingia calabura)*, අරළු *(Terminalia chebula)*, කටකෑල *(Bridelia retusa)* සහ බෝමී *(Litsea glutinosa)*, කායා *(Khaya senegalensis)*, මැහෝගනි *(Swietenia macrophylla)*, කලුවර *(Dioapyros ebenum)*, ගැඩුඹ *(Trema orientalis)* හා තෙලඹු *(sterculia foetida)* යන ශාක විශේෂවල ද බීජ ප්‍රරෝහණය සඳහා යෝග්‍ය ක්‍රම හඳුනාගැනීම.

- වර්ධක ප්‍රචාරණය

ලුණුම්දෙල්ල *(Melia dubia)* ශාක විශේෂයේ වර්ධක ප්‍රචාරණය.

(2) පර්යේෂණ නඩත්තු කටයුතු

කුරුණෑගල, ඇත්ගල පිහිටි මියන්මාර තේක්ක සහ වැඩිදියුණු කළ දේශීය තේක්ක ඇගයීම සඳහා වන බිම් කට්ටිය (හෙක්.19.3) සහ කුරුණෑගල, ඇත්ගල (හෙක්. 9.3) පිහිටි ක්ලෝනීකරණය ලද බීජ උද්‍යානය (හෙක්.10) නඩත්තු කරන ලදී.

යෝජිත නඩත්තු කටයුතු වලට අමතරව කුරුණෑගල ඇත්ගල පිහිටි තේක්ක බීජ උද්‍යානය 2020 ආශ්‍රිතව මායිම් සලකුණු කිරීම (මායිම් කණු 34) සහ ශාක අංකනය කිරීම සිදු කරන ලදී. කුරුණෑගල ඇත්ගල පිහිටි තේක්ක ජාන පර්යේෂණයේ ශාක අංකනය කරන ලදී.

කන්දකැටියේ ස්ථාපනය කරන ලද සිහින් පත්‍ර සහිත මැහෝගනී පර්යේෂණය (හෙක්. 0.5) වෙලන්හින්න ප්‍රදේශයේ ස්ථාපනය කරන ලද දේශීය ශාක විශේෂ වලට අදාළ පරීක්ෂණය (හෙක්. 1.5) හා ඔහියේ ස්ථාපනය කරන ලද *Eucalyptus microcorys* ශාක අතර තැබිය යුතු පරතරය පිළිබඳ පර්යේෂණය (හෙක්. 1.0) සඳහා ස්ථාපනය කරන ලද බිම් කොටස් හෙක්. 3.0ක නඩත්තු කරන ලදී.

(3) ක්ෂුද්‍ර ප්‍රචාරණය

වල්ලපට්ටා *(Gyrinops walla)* සහ තේක්ක *(Tectona grandis)* පිළිබඳ පටක රෝපණ පර්යේෂණ තවදුරටත් සිදු කරන ලදී.

(4) වන වගා සඳහා බීජ එක්රැස් කිරීම

2023 වර්ෂයේ වන වගා වැඩසටහන් සඳහා බීජ උද්‍යාන වලින් තේක්ක බීජ කිලෝ ග්‍රෑම් 100 සහ බදුල්ල ඔහිය ප්‍රදේශයෙන් *Eucalyptus grandis* බීජ කිලෝ ග්‍රෑම් 6.35ක් එක්රැස් කරන ලදී.

(5) දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය

පර්යේෂණ වගා 4ක අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී.

(6) පර්යේෂණ වගා මිනුම් කර සිතියම් සකස් කිරීම

(7) පර්යේෂණ පත්‍රිකා

- Zuhry ALM, Razmy AM (2021). Viability of Kithul *(Caryota urens L.,)* seeds with storage time. International journal of Agronomy and agricultural research. 19(6), 6-10
- Zuhry ALM, Alawathugoda RMD, Rajapaksha RGAS, Dissanayake DMKK, Kohombange S, Kukulevithana DT (2022). Fungal pathogens associated with the death of young potted Teak (Tectona grandis) stumps in the forest research nursery at Kumbalpola in Sri Lanka.Journal of Science-FAS-SEUSL (2022) 03(01) 17-23

2.1.13: ශ්‍රී ලංකා වන විද්‍යාලය

NVQ 5 ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් 31ක් සඳහා පැවැත්වීම. NVQ 5 (2021) විභාග පවත්වා අවසන්ව ඇත. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට හා වාචික පරීක්ෂණය කිරීමට නියමිතව ඇත. NVQ 6 පාඨමාලාවේ දේශණ හා ප්‍රායෝගික පරීක්ෂණ අවසන් කර ඇත. අවසන් පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කර එයට අදාළ ඉදිරිපත් කිරීම හා වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. එහි තෙවන හා සිව්වන විභාග ආරම්භ කිරීමට නියමිතව ඇත. NVQ 5 (2022) දේශණ අවසන් කර පළමු වාර විභාගය පවත්වා ඇත.

2.1.14: සම්පත් කළමනාකරණය

2022 වසරේ දී, අළුත්වැඩියා කරන ලද කාර්යාල, නිල නිවාස, සංචාරක බංගලා, පර්යේෂණ මධ්‍යස්ථාන හා තවාන් ගොඩනැගිලි 26ක් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වැඩිදියුණු කර ඇත. එමෙන් ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන වාහන යන්ත්‍රෝපකරණ හා උපකරණ අවශ්‍යතාවය අනුව නඩත්තු කර ඇති අතර දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර සීමිත ප්‍රතිපාදන මත අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ඇත.

2.1.15: වන ව්‍යාප්ති හා දැනුවත් කිරීම්

පරිසර සංරක්ෂණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගිනි කළමනාකරණ වැඩසටහන්, ශ්‍රමදාන, ප්‍රදර්ශන, තරඟ, ක්ෂේත්‍ර චාරිකා, පරිසර කඳවුරු හා වෙනත් විශේෂ වැඩසටහන් 968ක් පවත්වන ලද අතර පාසල් හා ප්‍රජා සහභාගිත්වයෙන් මාර්ග දෙපස, ජලාධාර අවට හා ගං ඉවුරුවල, පාසැල් හා රාජ්‍ය ආයතන භූමිවල, ආගමික සිද්ධස්ථාන භූමිවල මෙන් ම වෙනත් ස්ථානවල රුක්රෝපණ වැඩසටහන් 1004ක් ක්‍රියාත්මක කරන ලදී.





රූපය 02-14: වන ව්‍යාප්ති හා දැනුවත් කිරීම්

වගුව 02-8: දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන්

වැඩසටහන් වර්ගය	සංඛ්‍යාව
දැනුවත් කිරීමේ වැඩසටහන්	702
වැඩමුළු	14
ගිනි කළමනාකරණ වැඩසටහන්	86
ශ්‍රමදාන	37
ප්‍රදර්ශන	05
තරඟ	01
ක්ෂේත්‍ර චාරිකා	12
වෙනත් විශේෂ වැඩසටහන්	111
එකතුව	**968**

වගුව 02-9: දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන්

ක්‍රියාකාරකම	සංඛ්‍යාව
මාර්ග දෙපස රුක් රෝපණය	111
ජලාධාර අවට හා ගං ඉවුරුවල රුක් රෝපණය	121
පාසැල්වල රුක් රෝපණය	249
රජයේ ආයතන භූමිවල රුක් රෝපණය	181
ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණය	146
නාගරික භූමිවල රුක් රෝපණය	13
වෙනත් ස්ථානවල රුක්රෝපණ	183
එකතුව	**1004**

2.1.16: බීජ පැළ නිපදවීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන තවාන් පැළ 667,274ක සංඛ්‍යාවක් 2022 වසර තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල නිපදවන ලදී. නිපදවන ලද සම්පූර්ණ තවාන් පැළ සංඛ්‍යාවෙන් පැළ 62,746ක් අලෙවි කරන ලද අතර, පැළ 292,823ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා හා රාජ්‍ය සහ වෙනත් විවිධ ආයතන වෙත නොමිලයේ ලබාදෙන ලදී. තවත් කොටසක් ජාතික රුක් රෝපණ වැඩසටහන් හා ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා යොදා ගන්නා ලදී.



රූපය 02-.15: බීජ පැළ නිෂ්පාදනය

වගුව 02-10: බීජ පැළ නිෂ්පාදනය

දිසාව	දෙපාර්තමේන්තු බීජ පැළ	රූට්බෝල් පැළ
රත්නපුර	57,000	-
කෑගල්ල	62,000	-
ගාල්ල	13,000	-
මාතර	14,050	-
හම්බන්තොට	19,000	-
අනුරාධපුර	49,000	150
පොළොන්නරුව	28,600	-
අම්පාර	19,000	-
ත්‍රිකුණාමලය	18,500	-
මඩකලපුව	30,000	-
මොණරාගල	21,000	-
බදුල්ල	26,500	-
නුවරඑළිය	11,000	-
මහනුවර	14,750	-
මාතලේ	17,000	376
කළුතර	13,700	-
ගම්පහ	32,830	250
පුත්තලම	18,000	-
කුරුණෑගල	19,000	600
වව්නියාව	75,844	50
මන්නාරම	28,000	-

මුලතිව්	45,000	-
කිළිනොච්චිය	34,500	-
එකතුව	**667,274**	**1,426**

2.1.17: නව ගොවි වන වගා ස්ථාපනය හා ගොවි වන වගා නඩත්තු කිරීම

2022 වර්ෂය තුළ ගොවි වන වගා හෙක්.431.25ක්, රත්නපුර, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, මොණරාගල, බදුල්ල, මාතලේ, පුත්තලම, කුරුණෑගල හා වව්නියාව දිසාවන්හි සාර්ථකව ස්ථාපනය කරන ලදී.

මෙම ගොවි වන වගාවන්හි සිටුවීම සඳහා තේක්ක පැළ 436,250ක් නිපදවා ඇති අතර ගොවීන් 665 දෙනෙකු සහභාගි කරවා ඇත.





රූපය 02-16: නව ගොවි වන වගා ස්ථාපනය හා ගොවි වන වගා නඩත්තු කිරීම

වගුව 02-11: නව ගොවි වන වගා ස්ථාපනය

දිසාව	ස්ථාපිත ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)	නිපදවූ පැළ සංඛ්‍යාව	සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	3.6	3,600	9
හම්බන්තොට	5	5,500	12
අනුරාධපුර	132.35	132,350	51
පොළොන්නරුව	10	10,000	25
අම්පාර	35	35,000	55
ත්‍රිකුණාමලය	10	11,000	20
මඩකලපුව	08	8,000	13
මොණරාගල	50	50,000	90
බදුල්ල	52	52,000	105

මාතලේ	55.4	55,000	156
පුත්තලම	15	15,000	23
කුරුණෑගල	39.9	43,800	76
වව්නියාව	15	15,000	30
එකතුව	**431.25**	**436,250**	**665**

වගුව 02-12: 2020/2021 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම

දිසාව	**2020 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)**	**2021 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.)**
රත්නපුර	-	37.6
හම්බන්තොට	-	31
අනුරාධපුර	15	318.3
පොළොන්නරුව	10	179.5
අම්පාර	10	65
ත්‍රිකුණාමලය	10	35
මඩකලපුව	05	18
මොණරාගල	15	44
මාතලේ	15	85.2
පුත්තලම	-	40
කුරුණෑගල	-	142.2
එකතුව	**80**	**995.8**

2020 වර්ෂය තුළ ගොවි වන වගා හෙක්ටයාර් 80ක් අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, මොණරාගල, මාතලේ යන දිසාවන්හි සාර්ථකව ගොවීන් 188ක සහභාගීත්වයෙන් නඩත්තු කරන ලදී. එමෙන්ම 2021 වර්ෂය තුළ රත්නපුර, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, මොණරාගල, මාතලේ, පුත්තලම හා කුරුණෑගල යන දිසාවන්හි හෙක්.995.8ක් තුළ ගොවීන් 2093ක සහභාගීත්වයෙන් නඩත්තු කරන ලදී.

2.1.18: වෙරළබඩ වන වගා ස්ථාපනය

2022 වර්ෂය තුළ වෙරළබඩ වන වගා හෙක්.85ක් හම්බන්තොට, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, පුත්තලම හා කිලිනොච්චිය යන දිසාවන්හි සාර්ථකව ස්ථාපනය කරන ලද අතර, වන වගා සඳහා පැළ 186,500ක ප්‍රමාණයක් නිපදවන ලදී.

වගුව 02-13: වෙරළබඩ වන වගා ස්ථාපනය

දිසාව	ස්ථාපිත වෙරළබඩ වනවගා ප්‍රමාණය (හෙක්.)	නිපදවූ පැළ සංඛ්‍යාව
හම්බන්තොට	01	2,500
අම්පාර	30	48,000
ත්‍රිකුණාමලය	20	55,000
මඩකලපුව	10	25,000
පුත්තලම	4	6,000
කිලිනොච්චිය	20	50,000
එකතුව	**85**	**186,500**

2.1.19: ගෙවතු සංවර්ධනය සහ ගෙවතු කළමනාකරණය කිරීම

මේ යටතේ ගෙවතු 5736ක් සඳහා සුදුසු පැළ සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදී. එමෙන්ම ගෙවතු කළමනාකරණ වැඩසටහන් 56ක් ද 2022 වර්ෂයේ මේ යටතේ ක්‍රියාත්මක කරන ලදී.

වගුව 02-14: ගෙවතු සංවර්ධනය සහ ගෙවතු කළමනාකරණය

දිසාව	සංවර්ධනය කරන ලද ගෙවතු	ගෙවතු කළමනාකරණ වැඩසටහන්
රත්නපුර	185	8
කෑගල්ල	330	4
ගාල්ල	75	3
මාතර	380	4
හම්බන්තොට	370	-
අනුරාධපුර	370	6
පොළොන්නරුව	240	-
අම්පාර	390	3
ත්‍රිකුණාමලය	330	4
මඩකලපුව	230	3
මොණරාගල	330	3
බදුල්ල	330	5

නුවරඑළිය	80	3
මහනුවර	370	4
මාතලේ	330	3
කළුතර	331	-
ගම්පහ	350	-
කුරුණෑගල	165	-
වව්නියාව	100	1
මුලතිව්	100	2
කිළිනොච්චිය	350	-
එකතුව	**5736**	**56**

2.1.20: තවාන් සංවර්ධනය කිරීම

2022 වර්ෂයේ දී දිසාවන් 21ක් තුළ පිහිටි දෙපාර්තමේන්තු පැළ තවාන් 13ක් සංවර්ධනය කරන ලදී. එහි දී තවාන් භූමි සැකසීම, තවාන් ප්‍රවේශ මාර්ග පිළිසකර කිරීම, තවාන් වැට සකස් කිරීම, ජල නල පද්ධති අලුත්වැඩියාව හා විසිරුම් ජල සම්පාදන පද්ධති සැකසීම, ජල ටැංකි හා ජල ටැංකි කුළුණු ස්ථාපනය කිරීම, මව් පාත්ති ස්ථාපනය, සෙවණ ගෘහ ඉදි කිරීම, හරිත ගෘහ තැනීම හා අලුත්වැඩියාව, තවාන් වටා අලි වැට ඉදිකිරීම් වැනි ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත.

2.1.21: 2020 වන ආවරණ සිතියම සකස් කිරීම

2020 වන ආවරණ සිතියම සකස් කිරීම සඳහා සකසන ලද මූලික සැලසුම් ඇසුරින් දිවයිනේ දිස්ත්‍රික්ක 25හි වන ආවරණය වෙනස්වීම digitize කිරීම සිදුකරන ලදී.

2.1.22: මිනුම් කිරීම හා මායිම් සලකුණු කිරීම

රටේ පවතින වනාන්තර ආරක්ෂා කර ගනිමින් ඒවා නිසි පරිදි පවත්වාගෙන යාමේ අරමුණ පෙරදැරි කරගෙන වනාන්තර වටා මායිම් කණු සිටුවා ආරක්ෂා කිරීම සිදුකරනු ලබන අතර මායිම් කණු සිටුවා නොමැති වනාන්තර මායිම් කිලෝ මීටර් 1198.2ක මායිම් කණු සිටුවීමට 2022 වර්ෂයේදී සැලසුම් කරන ලදී. එමෙන්ම මැනුම් කර නොමැති වනාන්තර මායිම් කිලෝ මීටර් 3135.54ක් GPS උපකරණය මඟින් මැනුම් කිරීමටද ඉලක්කගත කර තිබුණි. වනාන්තරවල සිදුවිය හැකි අනවසර ක්‍රියා පාලනය කිරීමට හා මහජනතාවට වනාන්තර පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන පරිදි දැන්වීම් පුවරු 450ක් සවි කිරීමටද සැලසුම් කරන ලදී. එහෙත් 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේදී පමණ රටේ ඇතිවූ ආර්ථික කඩා වැටීමත් සමඟ මෙකී කාර්යයන් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන ඉවත් කිරීම හේතුවෙන් සැලසුම් කරන ලද ඉලක්කයන් විශාල වශයෙන් අඩු කිරීමට සිදුවූ අතර

වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කර ගත හැකි වූයේ සැලසුම්ගත ඉලක්කවලින් අඩු කොටසක් පමණි.

ඒ අනුව, වර්ෂය අවසාන වන විට වනාන්තර මායිමේ මායිම් කණු සිටුවීටම හැකි වූයේ කිලෝ මීටර් 236.6 ක් පමණි. GPS මඟින් මැනුම් කිරීමේ ප්‍රගතිය කිලෝ මීටර් 2420.4ක් විය. වනාන්තර දැන්වීම් පුවරු සවිකිරීමද සීමා කිරීමට සිදුවූ අතර වර්ෂය අවසාන වන විට ස්ථාපිත කිරීමට හැකි වූයේ දැන්වීම් පුවරු 69ක් පමණි.

ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම්වල ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

වගුව 02-15: මිනුම් කිරීම හා මායිම් සලකුණු කිරීම

දිසාව	වනාන්තර මායිමේ කණු සිටුවීම (කි.මී.)			වනාන්තර මායිම GPS මඟින් මැනුම් කිරීම (කි.මී.)			වනාන්තර මායිමේ දැන්වීම් පුවරු සිටුවීම		
	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)	සංශෝධිත ඉලක්කය	ප්‍රගතිය	ප්‍රතිශතය (%)
අම්පාර	5.6	0	0	70	105.3	150	-	-	0
අනුරාධපුර	80.6	15.2	19	369	410	111	12	12	100
මඩකලපුව	59	0	0	462	423	92	-	-	0
ත්‍රිකුණාමලය	54	28.5	53	380	255	67	-	-	0
බදුල්ල	21.3	14.8	69	430.1	423	98	-	-	0
මහනුවර	17.5	11	63	36.5	38	104	-	-	0
මාතලේ	15.1	3	20	22	22	100	-	-	0
නුවරඑළිය	19	10.9	57	5.4	6.5	120	-	-	0
මොණරාගල	24.1	19.1	79	219.4	235.3	107	-	-	0
කිලිනොච්චි	20.3	15	74	25	25	100	10	10	100
මන්නාරම	37.5	0	0	0	0	0	-	-	0
මුලතිව්	73	19.5	27	25	25	100	6	6	100
වවුනියාව	59	33.5	57	43	34	79	22	22	100
කළුතර	13.2	6.1	46	14.2	14.2	100	10	10	100
කුරුණෑගල	23.5	10.5	45	110.2	101.8	92	-	-	0
ගම්පහ	5.5	0	0	10	5	50	-	-	0
පුත්තලම	18.5	6.1	33	108.5	63	58	-	-	0
ගාල්ල	27.4	12.6	46	65.5	48.5	74	9	9	100
හම්බන්තොට	8	0	0	0	0	0	-	-	0
කෑගල්ල	15	8	53	20.5	20.5	100	-	-	0
මාතර	11.1	0	0	137.55	119.8	87	-	-	0
රත්නපුර	39.8	22.8	57	56	45.5	81	-	-	0
එකතුව	**648**	**236.6**	**37**	**2,609.85**	**2,420.4**	**93**	**69**	**69**	**100**

2.1.23: භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය කළමනාකරණය කිරීම

මෙම අංශයේ තිබූ Esri ArcGIS මෘදුකාංගය යාවත්කාලීන කර සියලු පරිගණකවල ස්ථාපනය කරන ලදී. දැනට පවතින නවතම Esri ArcGIS සංස්කරණය වන ArcGIS Pro 2.8.0 හා 10.8.1 උපයෝගී කරගනිමින් වන ආවරණ සිතියම් සහ වෙනත් සිතියම් සැකසීම සිදු කරන ලදී.

2.1.24: ජාතික වන සංගණනය (NFI)

2022 වසරේදී ජාතික වන සංගණන දත්ත රැස්කිරීමේ දෙවන චක්‍රය ආරම්භ කළ අතර 2017 වර්ෂය තුළදී දත්ත රැස්කළ නියැදිවලටම ගොස් නැවත දත්ත ලබා ගැනීම සිදුකරන ලදී. එමඟින් වසර 05කට පසුව එක් එක් දත්තවල සිදුව ඇති විචල්‍යතා හඳුනා ගැනීමට හා විශ්ලේෂණය කිරීමට අවකාශය සලසා ගන්නා ලදී. ඒ අනුව දිවයින පුරා නියැදි 813ක දත්ත රැස්කිරීම සිදු කරන ලදී.

2.1.25: වනාන්තර සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම

මෙහිදී 2022 වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දිසා වන කාර්යාල 23 මූලික කර ගනිමින් නව වන කළමනාකරණ සැලසුම් 50 සකස් කිරීමට තිබූ නමුත් නව වන කළමනාකරණ සැලසුම් 201 සකස් කර අවසන් කර ඇත.

වගුව 02-16: නව වන කළමනාකරණ කටයුතු

අනු අංකය	වැඩසටහන	2022.12.31 දින වන විට අවසන් කල යුතු ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය	2022.12.31 දින වන විට ප්‍රධානසංවර්ධන වැඩසටහන් වල ලබා ඇති භෞතික ප්‍රගතිය	%
01	නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම	නව වන කළමනාකරණ සැලසුම් - 50	නව වන කළමනාකරණ සැලසුම් - 201	100%

2.1.26: නැවත වන වගා කිරීමේ වැඩසටහන

රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට දායකත්වය දක්වන පරිණත, කාර්මික වන වගා හෙක්.355.22ක් රාජ්‍ය දැව සංස්ථාව මඟින් පූර්ණ හෙලීම් සිදු කර 2022 වර්ෂයේ දී නැවත වන වගා ස්ථාපනය කරන ලදී. හෙක්.10ක පයිනස් වන වගා පළල් පත්‍ර සහිත වන වගා බවට පත් කිරීමත් විශේෂ අයවැය යෝජනා වැඩසටහන යටතේ හෙක්.106.73ක පරිණත වන වගා හෙලීම් කර වාණිජ වන වගා ස්ථාපනය කිරීමත් සිදු කරන ලදී.

රාජ්‍ය දැව සංස්ථාව මඟින් පූර්ණ හෙලීම් සිදු කර නැවත වන වගා සිදු කරන ලද පසුගිය වසර 03ක නොමේරූ වන වගා හෙක්.2366.53ක් ද පළල් පත්‍ර ලෙස පරිවර්තනය කරන ලද වන වගා හෙක්.57.5ක් ද 2021 වර්ෂයේ දී විශේෂ අයවැය යෝජනා වැඩසටහන යටතේ පරිනත වන වගා

හෙලීම් කර ස්ථාපනය කරන ලද වන වගා හෙක්. 75.05ක ද නඩත්තු කටයුතු සිදු කරන ලදී. එහිදී වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැළැක්වීම සහ පාළු පැළ සිටුවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන අතර වන වගා ස්ථාපනය කිරීමෙන් පසු පළමු වසරේ දී නඩත්තු වාර 03ක් ද දෙවන වසරේ දී නඩත්තු වාර 02ක් ද තෙවන වසරේ දී නඩත්තු 01ක් ද ලෙස නඩත්තු සිදු කර ඇත.

එමෙන් ම අස්වැන්න ඉහළ නැංවීමේ අරමුණින් වන වගා හෙක්.625.4ක් විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදි. කුරුණෑගල, මාතලේ, බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල හෙක්. 277.6ක පූර්ව වාණිජමය තුනී කිරීම් ද මුලතිව්, මාතලේ, නුවරඑළිය, අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල හෙක්ටයාර 231.4ක වාණිජමය තුනී කිරීම් ද මොණරාගල සහ මුලතිව් දිස්ත්‍රික්කවල හෙක්.116.4ක පශ්චාත් හෙලීම් සංගණනය ද ලෙස එම වන විද්‍යා ප්‍රතිකර්ම සිදු කර ඇත.




රූපය 02-17: නැවත වන වගා කිරීම

2.1.27: පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම

පුද්ගලික අංශයේ සංවිධාන 04ක (ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම, පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම සහ චිලව් මෝබයිල්, J.C.T කෙමිකල්ස්) සිය වාණිජ මට්ටමේ රෙසින් නිස්සාරණ කටයුතුවලට අදාළ ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වන වගාවල රෙසින් නිස්සාරණ කටයුතු 2022 වර්ෂය පුරා සිදු කරන ලදි. හෙක්.634.4ක ඉඩම් ප්‍රමාණයක් රෙසින් නිස්සාරණ කටයුතු සඳහා පුද්ගලික අංශය වෙත බදු දී ඇති අතර 2022 දී ඉන් ලද ආදායම රුපියල් මිලියන 8.97කි.




රූපය 02-18: පයිනස් වන වගා වලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම

වගුව 02-17: 2022 වර්ෂයේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ ලබාගත් බදු ප්‍රමාණය

සංවිධානයේ නම	බදු දුන් ඉඩම්ප්‍රමාණය (හෙක්.)	බදු ආදායම(රු.)
1. ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම	85.4	571,603.00
2. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම	158.8	1,604,211.07
3. විලව් මෝබයිල්	26.5	614,866.04
4.J.C.T කෙමිකල්ස්	363.7	6,182,900.00
එකතුව	**634.4**	**8,973.580.11**

2.1.28: 2022 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2022 වර්ෂය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රුපියල් මිලියන 966.46කි.මෙයට පරිණත වන වගා කළමනාකරණය මඟින් ලබා ගන්නා දැව වල වටිනාකම වන රුපියල් මිලියන 56.22 ද, පුනර්ජනනීය කැපීම් මඟින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රුපියල් මිලියන 903.04 ද, වන අපරාධවලින් අත්පත් කර ගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබා දුන් දැවවල වටිනාකම වන රුපියල් මිලියන 7.20 ද ඇතුළත් වේ.

2.1.29: පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන

පුද්ගලික අංශය සතු සම්පත් වන වගා සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණින් පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩසටහනේ අදියර දෙකක් වසර 2000 දී සහ 2002 දී දියත් කරන ලදි. 2019 වර්ෂයේ දී පුද්ගලික අංශය සමඟ ඇති කර ගත් ගිවිසුම් අනුව හෙක්.387.92ක නැවත වන වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

වගුව 02-18: පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන

දිස්ත්‍රික්කය	අඩවිය	ගිවිසුම් අංකය	විශේෂය	අදියර		ප්‍රමාණය (හෙක්.)
				I	II	
කුරුණෑගල	ගල්ගමුව	1070	තේක්ක	✓		17.80
	ගල්ගමුව	1108	තේක්ක	✓		11.142
	ගල්ගමුව	1091	තේක්ක	✓		6.244
අනුරාධපුරය	අනුරාධපුරය	2002/01	තේක්ක		✓	40.00
	අනුරාධපුරය	2002/09	තේක්ක		✓	83.00
	කැකිරාව	2002/07	තේක්ක		✓	35.00
	කැකිරාව	2002/05	තේක්ක		✓	4.00

	අනුරාධපුරය	2002/12	තේක්ක		✓	4.00
	අනුරාධපුරය	17	තේක්ක	✓		20.234
	කැකිරාව	177	තේක්ක	✓		4.00
පොළොන්නරුව	හබරණ	2002/26	මිශ්‍ර විශේෂ		✓	47.00
මාතලේ	නාඋල	1180	තේක්ක	✓		9.50
	නාඋල	1228	තේක්ක	✓		4.00
	නාඋල	2002/15	තේක්ක		✓	3.00
	නාඋල	2002/20	තේක්ක / කායා		✓	90.00
	නාඋල	2002/18	තේක්ක		✓	5.00
	නාඋල	2002/16	තේක්ක		✓	4.00
එකතුව				**07**	**10**	**387.92**

2.1.30: නැවත වන වගා කිරීම සඳහා බීජ පැල නිෂ්පාදනය

නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා බීජ පැළ 1,545,852ක් නිෂ්පාදනය කරන ලදී. මෙහි දී තේක්ක, ඉයුකැලිප්ටස්, කායා, හල්මිල්ල සහ දේශීය විශේෂ මෙම නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා භාවිත කරන ලදී.

කැබිලිත්ත රක්ෂිතය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ කායා සහ දේශීය මිශ්‍ර පැළ 702,000ක් නිෂ්පාදනය කරන ලදී.

වගුව 02-19: නැවත වන වගා කිරීම සඳහා බීජ පැල නිෂ්පාදනය

දිස්ත්‍රික්කය	**විශේෂය**	**බීජ පැල සංඛ්‍යාව**
අම්පාර	තේක්ක/කායා	19,000
අනුරාධපුරය	තේක්ක/කායා	180,048
මඩකලපුව	තේක්ක/කායා	85,000
පොළොන්නරුව	තේක්ක/මිශ්‍ර	127,200
රත්නපුර	යුකැලිප්ටස් ග්‍රාන්ඩිස්/මිශ්‍ර	60,800
මාතර	දේශීය මිශ්‍ර	25,000
මාතලේ	තේක්ක/හල්මිල්ල	60,000
නුවරඑළිය	දේශීය මිශ්‍ර	113,344

බදුල්ල	යුකැලිප්ටස් ග්‍රාන්ඩිස්/ යුකැලිප්ටස් මයික්‍රෝ/තේක්ක	344,110
මොණරාගල	තේක්ක/කායා/ඇත්දෙමට	95,450
මහනුවර	ඉයුකැලිප්ටස්ග්‍රාන්ඩිස්	17,600
කළුතර	කායා	84,500
කුරුණෑගල	තේක්ක/කායා/මිශ්‍ර	223,600
මුලතිව්	කායා	26,200
වවුනියාව	තේක්ක	33,000
ත්‍රිකුණාමලය	තේක්ක	51,000
එකතුව		**1,545,852**



රූපය 2.19: නැවත වන වගා කිරීම සඳහා බීජ පැළ නිෂ්පාදනය

2.2: 2022 වසරේ ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන්

2.2.1: වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ ක්ෂේත්‍ර වැඩසටහන (IUFRO ආයතනය අනුග්‍රහයෙන්)

- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුළ ස්වාභාවික පුනර්ජනනයට ආධාර කිරීම සඳහා ආක්‍රමණික ශාක ඉවත් කිරීම (හෙක්. 20) වැඩ අවසන් කර ඇත.
- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුළ කි.මී. 16.5ක් දුරකට මාර්ගය දෙපස යටි කැළය කපා ආක්‍රමණික ශාක ඉවත් කර වන අලින් නිරීක්ෂණයට සුදුසු පරිදි සකස් කිරීම වැඩ අවසන් කර ඇත.
- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුළ සෆාරි ජීප් රථ මාර්ගය වීරමණ්ඩිය හා මොණරපිටිය අතුරු මාර්ග අළුත්වැඩියා කටයුතු කි.මී. 3ක වැඩ අවසන් කර ඇත.
- හබරණ හුරුළු පාරිසරික වනෝද්‍යානය තුළ සෆාරි ජීප්රථ මාර්ගය බෝගහපිටිය අතුරු මාර්ගය අළුත්වැඩියා කටයුතු කි.මී. 1.5ක වැඩ අවසන් කර ඇත.
- හුරුළු රක්ෂිත වනය තුළ හෙක්. 20ක භූමි ප්‍රමාණයක ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරීමට සහය වීම. (ANR-Assisted Natural Regeneration)

2.2.2: සුළු කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය වගා ව්‍යාපෘතිය (ජාතික ශිල්ප සභාවේ අනුග්‍රහයෙන්) ක්‍රියාත්මක කිරීම

- හණ වගා කිරීමේ ව්‍යාපෘතිය (2022) - මොණරාගල දිසාව-හණ පැළ 10,000ක් සිටුවා ඇත.
- වේවැල් වගා කිරීමේ ව්‍යාපෘතිය (2022) - මාතර දිසාව-හෙක්. 05ක පැළ 2500ක් සිටුවා අවසන් කර ඇත.
- හණ වගා ව්‍යාපෘතිය (2021) නඩත්තු කටයුතු අවසන් කර ඇත- අනුරාධපුර දිසාව
- හණ වගා ව්‍යාපෘතිය (2021) නඩත්තු කටයුතු අවසන් කර ඇත- මොණරාගල දිසාව
- වේවැල් වගා ව්‍යාපෘතිය (2021) නඩත්තු කටයුතු අවසන් කර ඇත - මාතර දිසාව

2.2.3: පරිණත වන වගා හෙලීම් කර නැවත වන වගා කිරීම

තුරු ආවරණය වැඩි කිරීම සඳහා හෙක්. 1067.73ක පරිණත වන වගා හෙලීම් කර වාණිජ වන වගා ස්ථාපනය කිරීම ද හායනයට පත් වත්තේගම කැබිලිත්ත රක්ෂිතයේ හෙක්. 1033.6ක පැළ සිටුවා රක්ෂිත ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට ද කටයුතු සිදු කරන ලදී. 2021 වර්ෂයේ දී පරිණත වන වගා හෙලීම් කර, නැවත ස්ථාපනය කරන ලද හෙක්. 75.05ක වාණිජ වන වගා වල පළමු වසර නඩත්තුවත් හායනයට පත් භූමිවල හෙක්. 883.5ක ස්ථාපිත වාණිජ වන වගාවල පළමු වසර නඩත්තුවත් සිදු කරන ලදී.

2.2.4: ගැසට් මඟින් වනාන්තර ප්‍රකාශයට පත් කිරීම

වනාන්තර 61ක් මැනුම් කර GPS බණ්ඩාංක මෙම අංශය වෙත ක්ෂේත්‍ර කාර්යාල වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවායේ බොහොමයක උපලේඛන සැකසීම අවසන් කර ඇත.

පසුගිය වර්ෂය තුළ (2021) වනාන්තර 40ක් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, එම වර්ෂයේදී වනාන්තර 151ක් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා උපලේඛණ සකස් කරන ලදී. තවත් වනාන්තර 12 ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහා සම්පූර්ණ කරන ලදී. ඒ අතුරින් වනාන්තර 03ක් 2022 වසරේදී ගැසට් කරන ලදී.

වගුව 02-20: රජයේ වනාන්තර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම

අනු අංකය	ගැසට්පත්‍ර අංකය	ගැසට්පත්‍රයේ දිනය	**රක්ෂිත/ රක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට අදාළ විස්තර**
01	2297/47	2022.09.14	අම්පාර දිස්ත්‍රික්කය / ගල්වල යාය වනාන්තරය රක්ෂිත වනාන්තරයක් බවට පත් කරන ලදී.
02	2309/52	2022.12.10	මඩකලපුව දිස්ත්‍රික්කය / වාකනේරි රක්ෂිතයෙන් හෙක්. 395.1ක් රක්ෂිත භාවයෙන් නිදහස් කිරීම.
03	2278/04	2022.05.04	රත්නපුර දිස්ත්‍රික්කය/රජවක රක්ෂිතයෙන් හෙක්. 27.3684ක් රක්ෂිත භාවයෙන් නිදහස් කිරීම.

2.3: 2022 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණදීමට සිදු වූ අභියෝග

2.3.1: මූලධන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

වාර්ෂිකව ලබාදෙන මූලධන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වාර්ෂිකව සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම අභියෝගයක්ව පවතී.

වන නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් වන වගා ස්ථාපනය කිරීමට හා තිරසාර ලෙස වන වගා කළමනාකරණය කිරීම සඳහා 2023 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 350ක ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම ප්‍රතිපාදනවලින් කොටසක් මේ වන විට ස්ථාපනය කර ඇති වන වගා වසර 03ක් යන තුරු නඩත්තු කිරීමට සහ වන විද්‍යාත්මක මෙහෙයුම් සිදු කිරීමට යොදා ගනු ලැබේ. තව ද, 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලද විශේෂ අයවැය යෝජනා වැඩසටහන මේ වන විට අත්හිටුවා ඇති බැවින් මෙම වැඩසටහන යටතේ ස්ථාපනය කරන ලද වාණිජ වන වගා හෙක්ටයාර 1065.28 වසර 03ක් යන තුරු නඩත්තු කිරීම සඳහා ද මෙම ප්‍රතිපාදන යොදා ගැනේ.

වාර්ෂිකව හෙක්ටයාර 900ත් 1000ත් අතර ප්‍රමාණයක පරිණත වන වගා පූර්ණ හෙලීම් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරන අතර හෙලීම් කිරීමෙන් පසු නැවත වන වගා කිරීම සඳහා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණවත් වන්නේ සීමිත වන වගා ප්‍රමාණයක් ස්ථාපනය කිරීම සඳහා වීම වර්තමානයේ දී මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන අභියෝගයකි. පසුගිය වසර කිහිපය තුළ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ රාජ්‍ය දැව සංස්ථාව විසින් වාර්ෂිකව සිදු කරනු ලබන හෙලීම් ප්‍රමාණය ප්‍රමාද වීම මත නැවත වන වගා කිරීම් ඉදිරි වර්ෂය වෙත ගෙන යාමට සිදු වීම නිසා නිෂ්පාදනය කරන ලද පැළ, තවාන් තුළ අමතර කාලයක් නඩත්තු කිරීමට ද මෙම ප්‍රතිපාදනවලින් කොටසක් යොදා ගැනීමට සිදු වී තිබේ. ඒ අනුව වන වගා ස්ථාපනයට සහ කළමනාකරණය කිරීම සඳහා වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කර ලබා දෙන්නේ නම් දැනට සිදු කරනු ලබන නැවත වන වගා ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක නැවත වන වගා සිදු කිරීමට හැකියාව පවතී.

2.3.2: විවිධ කාළගුණ විපර්යාස හා ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන හානි

2.3.3: ගවයින්ගෙන් හා වන සතුන්ගෙන් සිදුවන හානිය

2.3.4: මානව සම්පත් හිඟකම

කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇති අතර එය දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමේ දී සහ වන අපරාධ වැළැක්වීම කෙරෙහි දැඩි ලෙස බලපාන කරුණකි.

2.3.5: රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම

ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන්ගේ ආකර්ෂණය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත.

මේ වෙනුවෙන් දේශීය පෞද්ගලික අංශයන්ගේත් විදේශීය අංශයේත් මූල්‍ය දායකත්වයක් ලබාගතහැකි පරිදි රාජ්‍ය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදු කලයුතු අතර ඒ තුලින් අපේක්ෂිත වන ආවරණය 32%ක් දක්වා වැඩි කිරීමේ ඉලක්කයට ළඟා වීම වඩා කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇත.

2.4: වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම

2.4.1: වන ආවරණය ඉහළ නැංවීම

2030 වන විට ශ්‍රී ලංකාවේ වන වැස්ම 32%ක් දක්වා වැඩි කිරීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත අදාල ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම හා මාර්ගෝපදේශ සකස් කිරීම.

2.4.2: වනාන්තර කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම

දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින වනාන්තර විද්‍යාත්මක කළමනාකරණය සම්බන්ධයෙන් දැනට සකස් කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීමත්, සියලු වනාන්තර සඳහා වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමටත් අපේක්ෂා කෙරේ.

2.4.3: පාරිසරික සංචාරක ගමනාන්ත වල පහසුකම් හා සේවාවන් දියුණු කිරීම

2019 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාරිසරික සංචාරක අංශය මඟින් උපයන ලද ආදායම රුපියල් මිලියන 138කි. 2025 වර්ෂය වන විට රුපියල් මිලියන 500 දක්වා හා දැනට පරිසර සංචරණ මඟින් ග්‍රාමීය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා පාරිසරික සංචාරක ගමනාන්ත වල පහසුකම් හා සේවාවන් වැඩි දියුණු කිරීම, දැනට පවතින හා අළුතින් හඳුනාගත් නව සංචාරක ගමනාන්ත හා මංපෙත් වලට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පෞද්ගලික අංශයේ සහභාගීත්වය, සේවක සංඛ්‍යාව ඉහළ නංවා සේවය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනීම උදෙසා නව නිළධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ විධිමත් ප්‍රචාරණය මඟින් සංචාරකයින් දැනුවත් කිරීම හා අවශ්‍ය තොරතුරු ලබා දීමට අපේක්ෂා කෙරේ.

2.4.4: අනාගත පරපුර හා ප්‍රජාවගේ පාරිසරික සාක්ෂරතාවය ඉහළ නැංවීම

03 පරිච්ඡේදය


2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(2022 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙන් උපුටා ගන්නා ලදී.)

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

වගුව 03-1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



එෂිඒ-එන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කණ්ඩායම 2022 රු.	2021 රු.	
1,730,000,000	ආදායම් ලැබීම්		2,214,517,512	1,310,446,297	
-	ආදායම් බදු	1	-	-	
130,000,000	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	133,201,789	126,523,936	එෂිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
1,600,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	2,081,315,722	1,183,922,361	
1,730,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**2,214,517,512**	**1,310,446,297**	
60,000,000	**ආදායම් නොවන ලැබීම්**		**2,426,526,895**	**2,494,368,658**	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,418,310,000	1,746,050,000	එෂිඒ-3
-	කැන්පතු		937,438,092	503,126,773	එෂිඒ-4
60,000,000	අත්තිකාරම් ගිණුම්		70,778,803	61,694,141	එෂිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
60,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,426,526,895**	**2,310,870,914**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**4,641,044,407**	**3,621,317,211**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	4,772,509	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**4,641,044,407**	**3,616,544,702**	
	අඩු කළා : වියදම්				
1,643,000,000	**පුනරාවර්තන වියදම්**		**1,589,762,113**	**1,485,116,065**	
1,500,000,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,444,155,762	1,321,982,268	
132,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	136,808,603	153,579,662	එෂිඒ-2(ii)
10,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	8,797,748	9,554,135	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,643,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,589,762,113**	**1,485,116,065**	
566,000,000	**මූලධන වියදම්**			**1,293,994,215**	
18,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	17,846,027	39,179,834	
543,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	510,957,007	1,245,862,168	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		එෂිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
2,000,000	හැකියා වර්ධනය	14	1,650,518	5,577,426	
2,000,000	වෙනත් මූලධන වියදම්	15	1,624,820	3,374,787	
566,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**532,078,372**	**1,293,994,215**	
	කැන්පතු ගෙවීම්		921,792,473	411,710,666	එෂිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		67,511,417	74,147,822	එෂිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**989,303,890**	**485,858,488**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**3,111,144,375**	**3,264,968,768**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		1,529,900,032	**351,575,934**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		1,529,696,093	190,394,888.00	එෂිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		203,940		එෂිඒ-3
			203,940	**356,348,443**	

1

3.2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගුව 03-2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	4,210,202,677	2,521,122,965
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	214,541,355	225,189,977
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	203,940	-
මුළු වත්කම්		**4,424,947,972**	**2,746,312,942**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(617,472,940)	(591,046,369)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,210,202,677	2,521,122,965
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	832,014,295	816,236,346
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	203,940	-
මුළු වගකීම්		**4,424,947,972**	**2,746,312,942**

පිටු අංක 7 සිට 35 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023.05.26

R.M.C.M. Herath
Secretary
Ministry of Wildlife and
Forest Resources Conservation

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023.05.19

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023.05.19

2

3.3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

වගුව 03-3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්		904,416,020
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,010,550,895	88,594,907
අග්‍රිම ලැබීම්	1,418,310,000	1,746,050,000
අත්තිකාරම් අයකර ගැනීම්	80,099,637	1,605,420
තැන්පතු ලැබීම්	937,438,092	503,126,773
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,446,398,625**	**3,243,793,120**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,580,114,947	1,324,982,268
සහනාධාර සහ මාරුකිරීම්		9,554,135
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	344,795,253	487,235
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	4,772,509
අත්තිකාරම් ගෙවීම්	67,413,640	74,147,822
තැන්පතු ගෙවීම්	921,792,473	411,710,666
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,914,116,313**	**1,825,654,635**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**532,282,312**	**1,418,138,485**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	532,078,372	1,324,052,365
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**532,078,372**	**1,324,052,365**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(532,078,372)**	**(1,324,052,365)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**203,940**	**94,086,120**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	203,940	94,086,120
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4: මූල්‍ය ප්‍රකාශ සටහන්

1.වාර්තාකරණ කාල පරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාල වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2.මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදුකරයි .මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4.දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ .දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6.මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5: ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

වගුව 03-4 : ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු .,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු).	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
1003:07 :03	පුද්ගලික ඉඩම් වලින් දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු	130,000	130,000	133,201	102
2002:01 :02	රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම්	1,600,000	1,600,000	2,081,315	130

3.6: වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

වගුව 03-5: ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,643,000	1,643,000	1,581,458	96
ප්‍රාග්ධන	566,000	566,000	532,078	94

3.7: මු.රෙ 208.ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගුව 03-6: මු.රෙ.208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
130	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	නවක උපාධිධාරීන් සඳහා වැටුප් හා චේතන, දීමනා ලබාදීම	43,015	43,015	42,273	97
161	වනජීවී හා වන සම්පත් අමාත්‍යාංශය	වන වගාව පුළුල් කිරීම මඟින් වන ඝනත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම	394,295	329,295	298,126	90.53


3.8: මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වගුව 03-7: මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම

රු. ,000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	411,448	411,448	-	-
9152	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	143,738	143,738	-	-
9153	ඉඩම්	3,377,316	3,377,316	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	7,614,488	7,614,488	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	0	0	-	-
9160	කෙරීගෙන යන වැඩ	84,545	84, 545	-	-
9180	බදු දෙන ලද වත්කම්	0	0	-	-

3.9: විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එන්ඩබ්ඵල්/ඒ/ඩීෆ්සී/02/එෆ්ජ්/2022/19 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ජූලි 28 දින

වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ගණන්දීමේ නිලධාරී වෙත යථාකාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
154(6) 1.6.1 (අ)	2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකමෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.369,361,875 ක වෙනසක් පැවතීම හේතුවෙන් නිවැරදි දත්ත ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව.	1.6.2 (ආ)

154(6) 1.6.1 (ඇ)	2021 ජනවාරි 01 දිනට රු.415,455 ක් වූ නිල නිවාස වටිනාකමට එකතු කළ රු.3,370,000 ක වටිනාකම සනාථ කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අනුව නිවැරදි දත්ත ඇතුළත් කර ගිණුම් පිළියෙල කර අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු බව.	1.6.2 (ඇ)
154(6) 1.6.1 (ඉ)	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුළ දරන ලද රු.1,237,217,599 කින් රු.1,188,135,714 ක් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට ඇතුළත් කර නොතිබීම අනුව නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු බව.	1.6.2 (ඇ)

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් 2023 අප්‍රේල් 25 දින එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගන්නා ලදී. නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 31 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව ප්‍රමාද කාලය මාස 03 ක් විය.

1.6.2 **ආදායම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 වර්ෂය සඳහා රජයේ කැළෑවලින් ලැබෙන ආදායම්, වාර්ෂික මූලික ඇස්තමේන්තු අනුව රු.මිලියන 2,500 ක් ද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව රු.මිලියන 3,000 ක් ද වූ නමුත් ආදායම් ගිණුමෙහි මූලික ඇස්තමේන්තුව රු.මිලියන 1,600 ක් වශයෙන් දක්වා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සඳහන් කර නොතිබුණි. එසේම වර්ෂය තුළ රැස්කළ තත්‍ය ශුද්ධ ආදායම රු.මිලියන 2,081.3 ක් වූයෙන් රු.මිලියන 918.7 කින් සංශෝධිත ආදායම කරා ලඟාවීමට නොහැකි වී තිබුණි.

(ආ) 2021 වර්ෂයේ රජයේ කැළෑවලින් ලැබෙන ආදායම් ගිණුමෙහි උපලේඛන 05 අනුව පසුගිය වසරට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම රු.555,018,063 ක් වූවද, 2022 වර්ෂයට අදාළ ආදායම් ගිණුමෙහි (DGSA –revenue 02) සහ ඊට අදාළ හිඟ ආදායම් ප්‍රකාශයෙහි එය රු.488,264,949 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම රු.66,753,114 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ රජයේ කැළෑවලින් ලැබෙන ආදායම් ගිණුමට අදාළ හිඟ ආදායම් වාර්තාව අනුව 2022 ජනවාරි 01 දිනට රු.1,060,445,374 ක් වූ පෙර වර්ෂයන්ට අදාළ හිඟ ආදායම 2022 දෙසැම්බර් 31 දිනට රු.59,920,642 ක් වීමෙන් 2022 වර්ෂය තුළ පෙර වර්ෂ වෙනුවෙන් රැස්කළ හිඟ ආදායම රු.1,000,524,732 ක් විය. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ (DGSA-revenue 02) එම හිඟ ආදායම රු.901,779,894 ක් වශයෙන් දක්වා තිබීමෙන් රු.98,744,838 ක වෙනසක් නිරූපණය විය.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට පුද්ගලික දැව ප්‍රවාහන ආදායම් ගිණුමේ හිඟ ආදායම් ප්‍රකාශය අනුව පසුගිය වර්ෂයට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම රු.255,720 ක් වූවද, 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ (DGSA-revenue 02) එය රු.706,577 ක් ලෙස දැක්වීමෙන් රු.450,797 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් වාර්තාව අනුව, අම්පාර දිසා වන කාර්යාලයට අදාළව 2019 වර්ෂයේදී හඳුනාගත යුතු රු.32,733,901 ක හිඟ ආදායමක් 2022 වර්ෂයේදී හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණු අතර එයින් රු.31,982,888 ක් 2022 වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් ගණනය කිරීමේ පද්ධතිය සතුටුදායක නොවන බවට නිරීක්ෂණය විය.

(ඊ) පොළොන්නරුව සහ මුලතිව් දිසා වන කාර්යාල විසින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ගල්කොරි භිමියන් දෙදෙනෙකුගෙන් හා පුද්ගලික සමාගමකින් අය කරගත යුතු පිළිවෙලින් රු.77,366,295ක හා රු.121,613,898 ක හිඟ ගාස්තු අය කරගෙන නොතිබුණු අතර ඒවා හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශනයට ද ඇතුළත් කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන (SA 82) අනුව වැය විෂයයන් 14 ක් යටතේ මිලදීගෙන තිබූ එකතුව රු. 604,218,923 ක් වූ ස්ථාවර වත්කම් ශේෂයන් 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයන් ලෙස ගැනීමේ දී වැය විෂයයන් 09

ක වටිනාකම රු.1,988,535,398 ක් වැඩියෙන් ද, වැය විෂයයන් 05 ක වටිනාකම රු.700,225 ක් අඩුවෙන් ද ගිණුම්වල දැක්වීම හේතුවෙන් 2022 ජනවාරි 01 දිනට වත්කම් ශේෂය රු.1,987,835,173 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව දේපළ, පිරියත හා උපකරණවල රු.4,229,027,677 ක් වූ වටිනාකම රු.4,210,202,677 ක් වශයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබීමෙන් රු.18,825,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නිල නිවාසවල ආරම්භක ශේෂය වූ රු.415,455 ට එකතු කරන ලද රු.3,370,000 ක අගය තහවුරු කිරීමට අදාළ තොරතුරු 2023 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුළ දරන ලද එහෙත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණු රු.1,188,135,714 ක් 2022 වර්ෂයේ ගිණුම්වලට ද ඇතුළත් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව සතු මෝටර් සයිකල් 400 කට අධික ප්‍රමාණයක් තිබෙන නමුත් ඒවායේ වටිනාකම් නිවැරදිව තක්සේරු කිරීමට කටයුතු නොකර ඒවායෙහි වටිනාකම 37,500 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.6.4 තැන්පත් ගිණුම් ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) ගාල්ල දිසා වන කාර්යාලයේ 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන එන ලද තැන්පතු 09 කින් සැදුම්ලත් රු.466,016 ක තැන්පතු ශේෂය කිනම් වර්ෂයට අදාළ ද යන්න සනාථ නොකළ අතර ඒ තුළ ඇතුළත් දක්ෂිණ අධිවේගී මාර්ගයේ පැළ සිටුවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති රු.94,912 ක් හා නෙළුව ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දී ඇති රු.345,358 ක් අදාළ කාර්යයට යෙදවීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම් පුනස්ථාපනය කිරීම සඳහා 2007 වර්ෂයේ ලැබී වැය නොකළ රු.1,106,846 ක් වසර 16 ක් තිස්සේ ද, පරිසර සම්මත අධ්‍යයන වැඩසටහන් 15 ක පරිපාලන වියදම් වෙනුවෙන් ලබා දී තිබුණු රු.1,152,314 ක් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ ද, රු.380,273,079 ක් වසර 02 කට වැඩි කාලයක්

තිස්සේ ද මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුම් 04 ක රඳවා තිබුණි.

(ඇ) කැළෑ දෙපාර්තමේන්තු අරමුදලට අදාළව අංක 6000-0-0-21-0 දරන තැන්පත් ගිණුමට බැර කළ යුතු රු.119,403 ක තැන්පතු 04 ක් අංක 6000-0-0-13-0-69 දරන තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය	2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය	මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිකාවය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ලෙස පොත්පත් පවත්වාගෙන යායුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනය හෝ සිගාස් වැඩසටහනෙහි ස්ථාවර වත්කම් මොඩියුලයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	ණය හා අත්තිකාරම් ණයගැනි ලේඛනය, ණයහිමි ලේඛනය හා අත්තිකාරම් පාලන ගිණුම	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අත්තිකාරම් "බී" ගිණුම් සම්බන්ධයෙන් පවත්වාගත යුතු CC 10 ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	හානි හා පාඩු පිළිබඳ ලේඛනය	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 110	හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ)	බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	නිතිපතා බැරකම් පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ)	වැය ලෙජරය	මුදල් රෙගුලාසි 447	වැය ලෙජරය සම්පූර්ණ තොරතුරු සහිතව යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඊ)	ඉන්වෙන්ට්‍රි ලේඛනය	මුදල් රෙගුලාසි 454	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(උ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 880 සහ මුදල් රෙගුලාසි 891	ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් ද පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තු කළමනාකරණය යටතේ පවතින ඉඩම්වල පිහිටි කළුගල් කඩා ඉවත් කිරීමේ දී 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2020 වර්ෂය දක්වා අයකළ ගාස්තු, සාධාරණ හේතුවක් නොමැතිව සියයට 50 කින් අඩු කිරීමට 2020 නොවැම්බර් 13 දිනැති අංක 14/2020 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ගාස්තු අඩු කිරීම හේතුවෙන් රාජ්‍ය ආදායම විශාල ලෙස පහළ බැස තිබෙන බව 2021 වර්ෂයේ විගණනයෙන් පෙන්වා දී තිබුණ ද, ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු අතර 2022 වර්ෂයට අදාළව තොරතුරු ඉදිරිපත් කළ දිසාවන කාර්යාල 05 ක පමණක් කලු ගල් කැඩීමෙන් අහිමි වූ ආදායම රු.**18,204,346** ක් විය.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වූ කැළෑවලින් ලැබෙන ආදායම සහ පෞද්ගලික දැව ප්‍රවාහනයෙන් ලැබෙන ආදායම, නිවැරදිව ඇස්තමේන්තු කිරීම, හිඟ ආදායම් ගණනය කිරීම සහ අයකර ගැනීම සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබීමෙන් අදාළ පාර්ශවයන් රාජ්‍ය ආදායමට මුදල් බැර කිරීම පැහැර හරින බවට නිරීක්ෂණය වූ අතර

2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,491,611,273 ක් වූ හිඟ ආදායම 2022 දෙසැම්බර් 31 දිනට රු.1,885,180,372 ක් දක්වා ඉහළ ගොස් තිබුණි.

(ඇ) පුද්ගලික දුරකථන ආයතනයක් විසින් 2020 සහ 2021 වර්ෂවල දී දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08 ක් ඉදිකිරීමට අනුමැතිය ඉල්ලා තිබුණ ද, ඊට අදාළ කටයුතු අතපසු කිරීම හේතුවෙන් රජයට ලබා ගත හැකිව තිබූ බලපත්‍ර ආදායම අහිමි වී තිබුණි.

(ඈ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩි දියුණු කිරීම, අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය යනාදිය සඳහා අයවීමට ඇති ආදායම් ප්‍රමාණය හා එකතු කරන ලද ආදායම් ප්‍රමාණය පැහැදිලිව, ක්‍රමවත්ව හා නිවැරදිව හඳුනා ගතහැකි ආකාරයට වාර්තා පවත්වාගෙන නොතිබුණි.

(ඉ) හිඟ ආදායම් අයකර ගැනීම කාර්යක්ෂම නොවීම හේතුවෙන් 2021 වර්ෂය අවසානයේ පැවති රු.2,094,260 ක හිඟ ආදායමෙන් සියයට 69 ක් වූ රු.1,437,453 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට ඵළඹීම

2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා නිලධාරීන් සඳහා ගෙවිය යුතුව පැවති රු.784,303 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට

අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 2.4 (ඇ) සහ 3.1.4 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මු.රෙ.104(4)	අලාභ හානිය සිදුවූ දිනය සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 සහ 2021 වර්ෂවල සිදු වූ හානි සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබීමෙන් අලාභ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.
ii. මු.රෙ.371(5)	අත්තිකාරම් ලබා ගත් කාර්යය අවසන් කර දින 10 ක් තුළ අග්‍රිමය නැවත පියවිය යුතු වුවද, අවස්ථා 41 කදී ලබාගත් රු.637,480 ක අත්තිකාරම් පියවීමට දින 15 ක සිට දින 256 ක් දක්වා කාලයක් ගතකර තිබුණි.
iii. මුදල් රෙගුලාසි 395(ඇ)	එක් එක් මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කළ යුතු වුවද, 2022 වර්ෂයේ බැංකු ගිණුම් 29 කට අදාළ සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොවුණි.

iv. මුදල් රෙගුලාසි 396	කළාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයට අයත් බැංකු ගිණුම් 13 ක නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්මවූ එකතුව රු.544,505 ක් වූ චෙක්පත් 190 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
v. මුදල් රෙගුලාසි 565(3)	පොදු තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු තුලන ගිණුම් පිළියෙල කර නොතිබුණි.
vi. මුදල් රෙගුලාසි 565(5)	අත්තිකාරම් "ඛ" ගිණුමට අදාළව පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරනු ලබන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම සාරාංශ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.
(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 හා මුදල් රෙගුලාසි 507 හා 756	චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඊළඟ වර්ෂයේ ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2023 ජූනි මාසය වන විටත් 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර අවසන් කිරීමටත්, 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමටත් කටයුතු කර නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016	සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාලයකට පසුව හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනය කිරීමෙන් අනතුරුව හෝ එන්ජිම සම්බන්ධව ප්‍රධාන අලුත්වැඩියාවක් කිරීමකින් පසුව සිදු කළ යුතු වුවත් වර්ෂ ගණනාවක සිට වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණු අතර දැඩි ලෙස ඉන්ධන දහනය වන වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන නොතිබීමෙන් එන්ජිමේ දෝෂයක් නැත්නම් දූෂණයක් ද යන්න හඳුනාගත නොහැකි වී තිබුණි.

2.5 අවධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පුද්ගලික සමාගමක් විසින් පවත්වාගෙන ගිය කළුගල් කොරියක 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ සීමාව ඉක්මවා කැණීම් කරන ලද ගල් කියුබ් 541,471 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.133,093,715 ක් ඉදිරි වර්ෂ 3 ක් තුළ මාසික වාරික වශයෙන් අය කර ගැනීමට 2020 ඔක්තෝබර් මස ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට අය කරගත යුතුව තිබූ රු.77,638,000 කින් රු.66,158,183 ක් අය කරගෙන නොතිබුණු අතර රු.5,000,000 ක අග්‍රු වෙක්පතක් ද ඒ අතර විය.

(ආ) පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ (**ESCAMP**) ප්‍රතිපාදන යටතේ කන්නෙලිය රක්ෂිතයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ගිවිසුම් කාලය ද ඉක්මවා අතරමඟ නතර කර තිබුණු අතර ඒ සඳහා ගෙවන ලද රු.4,750,000 ක වැඩ මූලික අත්තිකාරම් මුදලින් රු.3,723,637 ක් ඉටුකළ වැඩ සඳහා කොටස් මුදල් ගෙවීමේ දී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඊට අදාළ ඇපකරයේ කාලය ද දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ කෙරෙහි වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශූන්‍ය ශේෂයක් පවතින බැංකු ගිණුම් 18 ක් සක්‍රීයව පවතී ද යන්න විගණනයට සනාථ නොකළ අතර මාස 06 කට වඩා කාලයක් අක්‍රීයව පවතින බැංකු ගිණුම් පිළිබඳව සොයා බලා ඒවා අවලංගු කිරීම කෙරෙහි ද අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට දිසා වන කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ බැංකු සැසඳුම් ප්‍රකාශ 19 ක අවස්ථා 188 කදී හඳුනා නොගත් ලැබීම් රු.19,338,009 ක් පැවති අතර ඒවා නිවැරදිව හඳුනා ගෙන මුදල් පොතට ගැලපීමට කටයුතු කර නොතිබීමෙන් මහ භාණ්ඩාගාරයට නිවැරදිව ගිණුම් පියවා ඇති බවට සනාථ කළ නොහැකි විය.

(ඇ) මුදල් රෙගුලාසි 169(2) ප්‍රකාරව රජයට ලැබෙන වෙක්පත් උපලබ්ධි වන තුරු කිසිම සේවාවක් නොසැපයිය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට කාර්යාල 02 ක මාස 06 ඉක්ම වූ එකතුව රු.66,129 ක් වූ උපලබ්ධි නොවූ වෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු නොකර බැංකු සැසඳුමට ඇතුළත්කර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වැඩි එන ඉල්ලුම සපුරාලීම මෙන්ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමනාකරණය කිරීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් අවසන් වන විට දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින රක්ෂිත, සංරක්ෂිත සහ වෙනත් කැළෑ ඉඩම් ප්‍රමාණය සහ ගැසට් කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනය වෙත ලබා දී නොතිබුණි.

(ආ) 2020 නොවැම්බර් 04 දිනැති අංක 1/2020 දරන වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය මඟින් ප්‍රකාරව රාජ්‍ය ආයතනයකට අයත් නොවන අවශේෂ කැළෑ ඉඩම් වෙනත් කාර්යයන් සඳහා භාවිතා කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉඩකඩ සලසා දීම හේතුවෙන් රක්ෂිත වශයෙන් දෙපාර්තමේන්තු පාලනය යටතේ තබා ගත යුතු ඇතැම් වන සම්පත් තව දුරටත් ආරක්ෂා කර ගැනීමේ හා තිරසාර සංවර්ධන ඉලක්ක ලභාකර ගැනීමේ තර්ජනයකට ලක්විය හැකි බවට නිරීක්ෂණය කෙරේ.

(ඇ) මුලතිවු දිසා වන කාර්යාල යටතේ පාලනය වන හෙක්ටයාර් 178,218.7 ක භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,550 ක් මැණුම් කර නොතිබුණු අතර 1932 වර්ෂයේ හෙක්ටයාර් 6,825 ක් හා ඊට වසර 80 කට පසු 2012 හා 2019 වර්ෂ අතර කාලය තුළ හෙක්ටයාර් 74,797.63 ක් ගැසට් කිරීමෙන් පසු මැණුම් කර තිබූ හෙක්ටයාර් 10,892.44 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම කුරුණෑගල දිසා වන කාර්යාලය යටතේ පාලනය වන හෙක්ටයාර් 52,395.21 ක භූමි ප්‍රමාණයෙන් මැණිම් කරන ලද හෙක්ටයාර් 13,377.06 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 1895, 1918, 1936 හා 1939 යන වර්ෂයන්හි ගැසට් කරන ලද කුරුණෑගල මොරගොල්ල, දේවගිරි කන්ද, තල්ගමුව හා මාරගල් කන්ද යන වනාන්තරවල හෙක්ටයාර් 352.6 ක් මැනීම් කර මායිම් තහවුරු කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. ඒ අනුව මැණුම් කිරීමේ හා ඉඩම් ගැසට් කිරීමේ කටයුතු මන්දගාමීව සිදු වන බවටත්, වන අපරාධ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී විවිධ ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමේ අවධානමක් පවතින බවටත් නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් වන වගාව සඳහා ව්‍යාපෘති 05 ක් යටතේ දිවයින පුරා පිහිටි පැළ තවාන් 40 ක පැළ නිෂ්පාදනය කරනු ලැබුවද, 2022 දෙසැම්බර් 31 දිනට එම පැළ තවාන්වල පවතින පැළ තොග සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) නියමිත කාල වකවානු තුළ පැළ සිටුවීමට හෝ පැළ බෙදාදීම සඳහා සැලසුම්ගත වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙන් මුලතිවු හි පිහිටි පැළ තවාන් 02 හි 2019 වර්ෂයේ සිට රෝපණය කරන ලද පැළ 197,736 කින් බොහොමයක් සහ ගල්ගමුව අඩවි වන කාර්යාලයට අනුබද්ධිත මැදගම පැළ තවානේ 2022 වර්ෂයේ හා ඊට පෙර නිපද වූ පැළ 67,375 කින් පැළ 6,748 ක් ද, 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) රු.70,716,004 ක ප්‍රතිපාදන මත රෝපණය කර නඩත්තු කරන ලද පැළ විශාල ප්‍රමාණයක් ද මියගොස් තිබුණු අතර තවත් විශාල පැළ ප්‍රමාණයක් අසාමාන්‍ය ලෙස වර්ධනය වී තිබුණි.

(ඊ) විශේෂ වන වගා ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ රු.77,964 ක වියදමකින් පොළිතින් ඇසුරුම්වල රෝපනය කරන ලද පැළ 1000 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිතයට නොගැනීමෙන් ප්‍රමාණය ඉක්මවා වර්ධනය වී තිබුණු අතර නාගරික තුරු ගොමුවල මාර්ග දෙපස, ඇවිදින මංතීරු දෙපස රෝපණය කිරීමට හා කොළඹ නගරයෙහි රුක් රෝපණ වැඩසටහන්වලට ලබාදීම සඳහා 2021 සහ 2022 වර්ෂවලදී මැදගම පැළ තවානේ රු.මිලියන 02 ක වියදමකින් නිෂ්පාදිත රූට්බෝල් පැළ 524 ක් නිකුත් කර නොතිබීමෙන් පැළ 103 ක් මිය ගොස් තිබුණි.

(උ) කුරුණෑගල දිසා වන කාර්යාලය මඟින් රාජ්‍ය දැව සංස්ථාවට පූර්ණ හෙළීම් සඳහා භාර දී තිබුණු වැඩ බිම් 81 ක නියමිත කාලය තුළ වැඩ නිම කරවාගෙන ආපසු භාරගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2023 පෙබරවාරි වනවිටත් භාර නොදුන් වැඩ බිම් සංඛ්‍යාව 27 ක් වීම හේතුවෙන් සැළසුම් කළ පරිදි නැවත වන වගා කිරීමට නොහැකි වී තිබුණි. එසේම ගල්ගමුව අඩවියේ අඹන්පොල බීට්ටුවේ වැඩ බිම් 03 ක ගස් 18,700 ක් පූර්ව වානිජ තුනී කිරීම් සඳහා 2021 අගෝස්තු 09 දින රාජ්‍ය දැව සංස්ථාවට භාර දී තිබුණ ද 2023 පෙබරවාරි 15 දින වන විටත් එම කාර්යය ඉටු නොකිරීමෙන් ඉතිරි ගස්වල වර්ධනය අඩාල වී තිබුණි. මෙම ප්‍රමාදයන් සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමටත් ප්‍රමාදයන් වළක්වා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් යෙදීමටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඌ) ගසක අපේක්ෂිත වර්ධන කාලය ඉක්ම වූ දිස්ත්‍රික්ක 08 ක වගා බිම් 234 ක් දැව හෙළීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට නිදහස් කර නොතිබීමෙන් එම වගා බිම් බහුලව වන අපරාධවලට සහ වෙනත් ස්වභාවික උවදුරුවලට ගොදුරු වී විනාශයට පත්වීමේ අවදානමක් පවතින බවටත්,

නියමිත කාල වකවානු තුළ ගස් හෙළීම් නොකිරීමෙන් රජයට රාජ්‍ය භාගය අහිමි වීමක් සිදුවන බවටත් නිරීක්ෂණය විය.

(එ) වන වගා කළමනාකරණය සහ පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකිරීමෙන් කෑගල්ල, ත්‍රිකුණාමලය සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි වගා බිම් 94 ක් අසාර්ථක වී තිබුණු අතර ඒවා පුනරුත්ථාපනය කර නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන ආයු කාලය සම්පූර්ණ වීමට ඉඩ හැර තිබුණු බවට නිරීක්ෂණය විය.

3.1.2 සැලැසුම් කිරීම

(අ) දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්කයන් ඇතුළත් කර නොතිබුණු අතර 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 මඟින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව රේඛීය අයිතමයන් යටතේ එක් එක් අංශය විසින් ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත වැඩ, භාණ්ඩ හා සේවා විස්තර හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල රාමුව ඇතුළත් කර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ද සකස් කර නොතිබුණි.

(ආ) බීජ සිටුවීම හා නඩත්තුව ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබුණ ද පැළ බෙදා හැරීම සම්බන්ධව ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර නොතිබීමෙන් සැළසුම්ගත වැඩ පිළිවෙළක් ඔස්සේ පැළ බෙදාහැරීම සිදුවන බවට සනාථ කරගත නොහැකිවිය.

3.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගල්ගමුව අඩවි වන කාර්යාලයට අනුබද්ධිත මැදගම පැළ තවානට ජල ටැංකියක් මිලදී ගැනීමට හා ඒ සඳහා කොන්ක්‍රීට් රැඳවුම සැකසීමට 2021 වර්ෂයේදී රු.250,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණ ද, 2023 පෙබරවාරි 15 දින වන විටත් කොන්ක්‍රීට් රැඳවුම සකස් කර නොතිබීමෙන් රු.62,000 කට මිලදී ගත් ජල ටැංකිය භාවිතයෙන් තොරව තබා තිබුණි.

(ආ) දැව හෙළීම් සිදුකරමින් පවතින කුරුණෑගල දිසාවේ අඩවි වන කාර්යාල 05 කට අයත් හෙක්ටයාර 108.7 ක් පමණ වන භූමි ප්‍රමාණයක නැවත වන වගා සඳහා සිටුවීමට අවශ්‍ය පැළ නිෂ්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාවන්හි එක් එක් ක්‍රියාකාරකම්වලට අදාළ මුල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුළත්කර නොතිබීමෙන් රු.මිලියන 566 ක ක්‍රියාකාරකම් ඇතුළත් සංශෝධිත

ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමට නොහැකි විය. ඒ අනුව අපේක්ෂිත ප්‍රගතිය ලඟා කරගෙන ඇති බවට සනාථ කරගත නොහැකි විය.

(ඇ) ඉඩම් හා ඉඩම් සංවර්ධනය සඳහා රු.මිලියන 26 ක් වෙන් කර තිබුණ ද ඒ යටතේ කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්යසාධන වාර්තාව වසරක ප්‍රමාදයකින් පසු 2023 ජූනි 06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.2,000,000 ක් ඉක්මවන කොන්ත්‍රාත් ලියාපදිංචි සමිතියකින් ඉටුකර ගත නොහැකි වුවද, කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ පැරණි දේශනාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු.2,547,166 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමේ හැකියාව තිබිය දී රු.1,816,008 ක් සහ රු.731,158 ක් බැගින් ඇස්තමේන්තු දෙකක් සකස් කර ප්‍රජාපාදක ගොවි සංවිධානයක් මඟින් ඉටුකරවාගෙන තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව e-GP පද්ධතිය යටතේ විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයේ සිට වසා දමා තිබුණු ගාල්ල දිසා වන කාර්යාලය යටතේ පාලනය වන වැකුණුගොඩ සංචාරක බංගලාව 2020 දෙසැම්බර් මස රු.687,337ක වියදමක් දරා අලුත්වැඩියා කර තිබුණ ද, 2023 ජූනි 30 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රුපියල් මිලියන 7 කට අධික ආදායම් උපයාගෙන තිබුණු කන්නෙලිය සංචාරක බංගලාව 2020 ජනවාරි සිට නඩත්තු කටයුතු වෙනුවෙන් තාවකාලිකව වසා දමා තිබුණ ද, අදාළ නඩත්තු කටයුතු සිදු නොකිරීම නිසා මලාපවහන පද්ධතිය විනාශ වී ගොඩනැගිල්ලේ බිත්ති ද ඉරිතලා ගොස් දැඩිලෙස හානියට පත්වීමේ අවධානමක් පැවතුණි. මේ නිසා සංචාරකයන්ට නවාතැන් පහසුකම් සැපයීම අඩපණ වී රජයට ආදායම් ද අහිමි වී තිබුණි.

(ඇ) පූර්ණ අලුත්වැඩියාවක් කළ යුතු කුරුණෑගල කුඹල්ගම සංචාරක බංගලාව සඳහා 2020 වර්ෂයේ දී රු.500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, අදාළ අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම හේතුවෙන් සංචාරක බංගලාවක පැවතිය යුතු ගුණාත්මකභාවය පවත්වා ගැනීමට නොහැකි වී තිබුණු අතර එම භූමියේ ඉදිකර තිබෙන ගොඩනැගිල්ලක් වසර ගණනාවක සිට භාවිතයට නොගැනීම හේතුවෙන් අබලන් වී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවට අයත් වාහන සංචිතය භෞතික සත්‍යාපනයක් සිදුකර නැති අතර වාහන 711 ක් පවතින බවට තොරතුරු ඉදිරිපත් විය. එසේ වුව ද, එයින් වාහන 288 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබීමෙන් එවායේ භෞතික පැවැත්ම සනාථ කළ නොහැකි විය.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන භාවිතා කළ ද, එම වාහන සංඛ්‍යාව හා එහි අයිතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට ද කටයුතු කර නොතිබුණි. ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සතු අංක 64-4438 දරන ලැන්ඩ් රෝවර් වර්ගයේ ජීප් රථයක් ගාල්ල දිසාවන කාර්යාලයේ 2017 වර්ෂයේ සිට ද, උතුරු නැගෙනහිර පළාත් සභාවට අයිති අංක 52 – 5093 දරන නිසාන් වර්ගයේ කැබ් රථයක් මන්නාරම් දිසාවන කාර්යාලයේ 2015 වර්ෂයේ සිට ද ධාවනයෙන් ඉවත් කර දිරායමින් පැවතුණි.

(ඊ) භාවිතයට ගත නොහැකි ලියාපදිංචි වර්ෂය ද නිරීක්ෂණය නොවූ යතුරු පැදි 13 ක් සහ පාපැදි 05 ක් වර්ෂ 04 කට අධික කාලයක් 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන මුදල් අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු නොකර ගාල්ල දිසාවන කාර්යාලයේ ගාල්කර තිබුණි.

(උ) ගල්ගමුව අඩවි වන කාර්යාලයේ වාහන 04 ක් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර ධාවන තත්ත්වයේ පවතින එහෙත් අළුත්වැඩියා කළයුතු වාහන 02 ක් නිසිකළට අළුත්වැඩියාවන් සිදු නොකර ගර්හිත තත්ත්වයට පත්වීමේ අවධානමක් පැවතුණි. වසර ගණනාවක සිට ගර්හිතව පවතින කුරුණෑගල දිසා වන කාර්යාලය, කුරුණෑගල අඩවි වන කාර්යාලය සහ මැල්සිරිපුර අඩවි වන කාර්යාලය සඳහා වෙන්කර තිබුණු වාහන 06 ක් ද අපහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඌ) අපහරණය කිරීම සඳහා හඳුනාගෙන තිබුණු වාහන 169 කින් තක්සේරු වාර්තා ලබාගෙන තිබූ වාහන 101 ක් සඳහා විවෘත මිලගණන් කැඳවීමටත්, වාහන 68 ක තක්සේරු වාර්තා ලබා ගැනීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් අපහරණය කිරීමට නොහැකි වී තිබුණි.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනයේ කොළ ඉරී හානියට පත්ව, අකුරු ද බොඳවී පිටු කිහිපයක් එකිනෙක අලවා තිබීමත්, 2011 වර්ෂයට පෙර සිදුවූ හානි හා පාඩු ඊට ඇතුළත් කර නොතිබීමත් හේතුවෙන් හානි හා පාඩු නිවැරදිව ලේඛන ගත කර ඛෙරුම් කර ඇද්ද යන්න විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය.

3.5 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අලව්ව- විහාරකන්ද 01/001 හි ඉඩම් හෙක්ටයාර් 35 ක 2020 වර්ෂයේ සිදුකළ "කායා" වන වගාව රැක ගැනීමට අපොහොසත් වීමෙන් 2023 පෙබරවාරි 14 දින වන විට සියයට 70 ක් පමණ සතුන් හානි කිරීම හේතුවෙන් විනාශ වී තිබුණු නමුත් 2022 වර්ෂය තුළ රු.3,886,452 ක් වැයකොට නඩත්තු 04 ක් ද, සිදු කර තිබුණි.

(ආ) කුරුණෑගල ඇත්ගාල වන වගාව ඇතුළුව වන වගා 04 ක් සඳහා 2022 සහ 2021 වර්ෂයන් හි දී නිෂ්පාදනය කරන ලද තේක්ක පැළ සහ කායා පැළ 51,449 ක් අධි වර්ධනය මත පොළිතීන් පුපුරා යෑමෙන් සහ කෘමි හානි වළක්වා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් විනාශ වී තිබුණු බැවින් ඒ වෙනුවෙන් දරන ලද රු.1,208,372 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශයේ අවශ්‍යතාව මත 2021 වසරේදී රු.500,000 ක වියදමින් නිෂ්පාදනය කරන ලද 12"X18" ප්‍රමාණයේ පැළ 5,000 ක් සහ රු.400,000 ක් වැය කර නිෂ්පාදනය කරන ලද අවශ්‍යතාවය නිශ්චිතව දක්වා නොතිබුණු 12"X18" ප්‍රමාණයේ පැළ 4,000 ක් 2023 පෙබරවාරි 15 දින වන විටත් අවශ්‍යතාවයක් නොවීම හේතුවෙන් ගල්ගමුව මැදගම පැළ තවානේ රඳවාගෙන තිබුණි.

3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණකාධිපතිවරයා විසින් 2019 හා 2020 වර්ෂයන්හි දී නිකුත් කරන ලද විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දැව ව්‍යාපාර වාර්ෂිකව ලියාපදිංචි කිරීම සම්බන්ධ කාර්යයන් ගාල්ල දිසා වන කාර්යාලය විසින් නිසි පරිදි ඉටු කර නොතිබුණු අතර ව්‍යාපාර කටයුතු නොකරන ආයතනවල ලියාපදිංචිය අවලංගු කිරීමටත්, බලපත්‍ර නොමැතිව දැව ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන සම්බන්ධයෙන් නීතීමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කුරුණෑගල දිසා වන කාර්යාලයේ පාලනය ඵටතේ පවත්වාගෙන යන දැව ව්‍යාපාර 370 ක් 2023 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කර නොතිබුණු අතර එමඟින් 2023 වර්ෂයේ පෙබරවාරි මස අවසාන වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමිවී ඇති මුළු ආදායම රු.3,058,907 ක් බවට නිරීක්ෂණය විය.

(ඇ) වන අපරාධ අවම කර ගැනීමට නොහැකි වීම, පවත්නා නඩු කාර්යක්ෂමව අවසන් කර ගැනීමට නොහැකි වීම, අවසන් වී ඇති නඩුවලට අදාළ දඩ මුදල් නිසි පරිදි අය කර ගැනීමට කටයුතු නොකිරීම යනාදී කරුණු හේතුවෙන් 2017 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මුලතිව් අඩවි වන කාර්යාලය සහ ඕළුමඩු අඩවි වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළි කිරීම්, ගස් හෙලීම්, දැව ප්‍රවාහනය වැනි වන අපරාධ පිළිවෙලින් 929 ක් සහ 491 ක් සිදු කර තිබුණි. එසේම කුරුණෑගල, ගල්ගමුව, මැල්සිරිපුර, කුලියාපිටිය සහ මහව යන අඩවි යටතේ පාලනය වන රක්ෂිත වනාන්තරවල හෙක්ටයාර් 253.053 කට හානි සිදු කිරීම සම්බන්ධ වන අපරාධ විශාල ප්‍රමාණයක් පවතින බවත්, නඩු විසඳීම මන්දගාමී වීමෙන් රජයට අයවිය යුතු ගාස්තු නියමිත කාලවකවානු තුළ අයකර ගැනීමට නොහැකි වී ඇති බවත්, වන අපරාධ දැව විශාල ලෙස ගොඩගැසී දිරාපත් වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.

(ඈ) වන සංරක්ෂණ ආඥා පනතේ 64 වගන්තියේ 2(ඇ)(i) ඡේදය ප්‍රකාරව වන අපරාධවලට යොදාගත් රාජසන්තක කරන ලද වාහන හා වෙනත් උපකරණ වෙන්දේසි කර ලැබෙන ආදායමෙන් හරි අඩකට නොඅඩු මුදලක් දෙපාර්තමේන්තු අරමුදලට බැර කළයුතු වුවත් රාජසන්තක කරන ලද එහෙත් කාලීනව වෙන්දේසි කිරීමට කටයුතු නොකළ ලොරි රථයක් සහ අත්ට්‍රැක්ටර් 08 ක් මැල්සිරිපුර අඩවි වන කාර්යාල පරිශ්‍රය, වැවරවුම පැළ කවාන් පරිශ්‍රය සහ කුරුණෑගල අඩවි වන කාර්යාල පරිශ්‍රය තුළ අනාරක්ෂිත ලෙස ගාල් කර තිබුණි.

(ඉ) කුරුණෑගල දිසාවන කාර්යාලයට අයත් අඩවි 05 ට අදාළ වන අපරාධ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා කාලය තුළ උසාවිවලින් ලැබුණු රු.10,009,477 ක දඩ මුදල්වලින් පනතේ 64 වගන්තියේ 2(ඇ)(i) ඡේදය ප්‍රකාරව නිලධාරින්ට පිරිනැමිය යුතු

තැගි මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි. එය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව අඩුවීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට මාස 03 ක සිට වසර 05 ක් ඉක්මවා ගොස් තිබුණු රු.8,912,194 ක සේවක ණය මුදල් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලශක්ති පුද්ගලික සමාගමකට 2015 පෙබරවාරි මස සිට පර්චස් 200 ක් බදු දී තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව පර්චසයක් සඳහා වසරකට රු.5,000 ක් බැගින් පළමු වසර සඳහා පමණක් රු.1,000,000 ක බදු මුදල් ලබාගෙන ඉන් අනතුරුව කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම සමාගම විසින් ගිවිසුම්ගත පර්චස් 200 ට අමතරව තවත් පර්චස් 523.78 ක් අනවසරයෙන් පරිහරණය කර තිබුණු අතර ඒ අනුව 2023 පෙබරවාරි 18 දින වන විට පර්චස් 723.78 ක් සඳහා වසර 08 ක් වෙනුවෙන් එම සමාගමෙන් අයවිය යුතු මුදල රු.40,349,839 ක් විය.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

"වනාන්තර ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම" සහ "භෞමික පරිසර පද්ධති හා තිරසාරව කළමනාකරණය කරන ලද වනාන්තර ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, කාන්තාරකරණයට එරෙහිව කටයුතු කිරීම, ජෛව විවිධත්ව හානිය වැලැක්වීම" වශයෙන් 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන තිබුණු ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 2 ක් යටතේ 2030 වර්ෂය වන විට වන ආවරණය සියයට 32 දක්වා වැඩි කිරීම ඉලක්ක කර තිබුණි. එසේ වුවද, 2022 වර්ෂයේ කාර්යසාධන පිළිබඳ තොරතුරු, මුළු වන ගහනය සහ ඊට සාපේක්ෂව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීමෙන් අරමුණු ලභාකරගත් බවට සනාථ කරගත නොහැකි විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	89	46	43
තෘතියික	44	16	28
ද්විතීක	1,462	1,192	270
සුළු	1,634	1,250	384
එකතුව	3,229	2,504	725

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 33 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 22 ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 86 දෙනෙකු හා බීට්ටු වන නිළධාරීන් 127 දෙනෙක් ද ඇතුළුව තනතුරු 725 ක් පුරප්පාඩු වී පැවතීම විශේෂයෙන් ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැලැක්වීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය.

ආර්.එම්.එම්.එස්. පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය
කාර්යසාධක දර්ශක

4.1: කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ

වගුව 04-1: ආයතනයේ කාර්යසාධන දර්ශක

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) නිමැවුම තත්‍ය		
		100%- 90%	**75%-89%**	**50%- 74%**
1	අලුත්වැඩියා කරන ලද ගොඩනැගිලි 26ක් (කාර්යාල හා නිල නිවාස ගොඩනැගිලි ආදිය) වැඩිදියුණු කර ඇත.	98%	-	-
2	අවශ්‍යතාවය පරිදි යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තු කර ඇත. (අංශවල ඉල්ලීම පරිදි)	91%	-	-
3	අවශ්‍ය පරිදි වාහන නඩත්තු කර ඇත (වැය ශීර්ෂ අංක 014)	96%	-	-
4	ඉන්ධන ලබාගැනීම (වැය ශීර්ෂ අංක 009)	100%	-	-
5	වාහන අලුත්වැඩියාව (වැය ශීර්ෂ අංක 203)	98%	-	-
6	ගෘහ භාණ්ඩ ලබාගැනීම	100%		-
7	උපකරණ හා යන්ත්‍ර ලබා ගැනීම	93%	-	-
8	Arc GIS මෘදුකාංග 05ක් යාවත්කාලීන කර නඩත්තු කිරීම	100%	-	-
9	වනාන්තර මායිම් කි.මී. 648ක මායිම් කණු සිටුවීම	-	-	37%
10	වනාන්තර මායිම් කි.මී. 2,609.9 ක් GPS උපකරණය මඟින් මැනුම් කිරීම	93%	-	-
11	දැන්වීම් පුවරු 69ක් සවි කිරීම	100%		
12	වන සංගණනය සඳහා දිවයින පුරා නියැදි 870ක දත්ත ලබා ගැනීම	93%	-	-
13	ශ්‍රී ලංකා වන විද්‍යායතනය විසින් NVQ 5 (2021) පාඨමාලාව සාර්ථකව නිම කර ඇත.	90%	-	-
14	ශ්‍රී ලංකා වන විද්‍යායතනය විසින් NVQ 6 (2022) හා NVQ 5 (2022) යන පාඨමාලා සාර්ථකව නිම කර ඇත.	-	80%	-
15	සංරක්ෂණ මධ්‍යස්ථාන 07ක්, සෆාරි මංපෙත් කි.මී.40ක් සංවර්ධනය කර නඩත්තු කර ඇත. සංචාරක ගමනාන්ත 15ක සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කර අනෙකුත් නඩත්තු කටයුතු සිදු කර ඇත.	90% – 100%	-	-
16	වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් 08ක් සිදුකිරීම	100%	-	-

17	වන ආවරණය ඉහළ නැංවීම යටතේ හෙක්.7758.16ක භූමි ප්‍රමාණයක වනාන්තර ප්‍රතිස්ථාපනය, හායනයට පත් වනාන්තර නඩත්තු, නැවත වන වගා නඩත්තු, නව වන වගා කටයුතු සිදු කිරීම යන ක්‍රියාකාරකම් සිදු කර ඇත. හෙක්.321.6ක කඩොලාන ප්‍රතිස්ථාපන හා නඩත්තු කටයුතු සිදු කර ඇත. වැව් තාවුළු සංරක්ෂණය යටතේ වැව් ආශ්‍රිතව හෙක්.195ක දේශීය ශාක සිටුවා සංරක්ෂණය හා නඩත්තු කටයුතු සිදු කොට ඇත.	90% – 100%	-	-
18	2022 වසර තුළ බීජ පැළ 940,000ක් නිපදවීම ඉලක්කය වූ අතර වර්ෂය අවසාන වන විට බීජ පැළ 667,274ක් නිෂ්පාදනය කිරීම සිදුවිය.	-	-	71%
19	ග්‍රාමීය ජනතාවගේ ආදායම වැඩි කරනු වස් 2022 වසර වන විට දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ අපේක්ෂිත සංවර්ධිත ගෙවතු ප්‍රමාණය 8,500ක් වන අතර වර්ෂය අවසාන වන විට ගෙවතු 5,736ක් වැඩිදියුණු කිරීම සිදුවිය.	-	-	67.5%
20	ශාක කළමනාකරණ වැඩසටහන් 100ක් 2022 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කළ අතර වර්ෂය අවසාන වන විට වැඩසටහන් 56ක් ක්‍රියාත්මක කිරීම සිදුවිය.	-	-	56%
21	2022 වර්ෂයේදී ගොවි වන වගා හෙක්. 600ක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කළ අතර වර්ෂය අවසාන වන විට ගොවි වන වගා හෙක්. 431.25ක් ස්ථාපනය කිරීම සිදුවිය.	-	-	71.9%
22	2020/ 2021 වර්ෂයන්හි ගොවි වන වගා නඩත්තුව හෙක්. 1095.8ක් වූ අතර, වර්ෂය අවසාන වන විට හෙක්. 1038.2ක් නඩත්තු කිරීම සිදු විය.	94.7%	-	-
23	වෙරළබඩ වන වගා ස්ථාපනය හෙක්. 100ක් 2022 වර්ෂයේ අපේක්ෂා කළ අතර වර්ෂ අවසානය වන විට හෙක්.85ක වෙරළ වන වගා ප්‍රමාණයක් ස්ථාපිත කිරීමට හැකිවිය.	-	85%	-
24	හෙක්. 43.62ක පයිනස් වනවගා පළල් පත්‍ර සහිත වනවගා බවට පත් කිරීම.	-	-	50%
25	හෙක්.862.53ක පරිණත වනවගා හෙලීම් කර නැවත වනවගා කිරීම.	-	-	54.74%
26	බීජ පැළ නිෂ්පාදනය (පැළ 1,545,852)	100%	-	-
27	හෙක්.1733.02ක නොමේරූ වන වගා නඩත්තු කිරීම.	100%	-	-
28	හෙක්.90.4ක මධ්‍ය කඳුකරයේ වනවගා නඩත්තු කිරීම.	-	80%	-
29	හෙක්.30ක මධ්‍ය කඳුකරයේ වන වගා ස්ථාපනය කිරීම.	100%	-	
30	හෙක්.85ක පළල් පත්‍ර වනවගා නඩත්තු කිරීම.	-	80%	-

31	ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කර ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ගිනි පටි කැපීම හා නඩත්තු කටයුතු සිදු කර ඇත.	90% – 100%	-	-
32	මෘදුකාංග සංවර්ධනය	100%		
33	නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම	100%	-	-
34	ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම හා නඩත්තු, කටුපඳුරු සහිත ඉඩම් වනාන්තර බවට පත් කිරීම යටතේ නඩත්තු, රණවිරු රුක්රෝපණය, අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීම යන ක්ෂේත්‍රයන් ඔස්සේ හෙක්.979.32ක ක්‍රියාකාරකම් සිදු කොට ඇත.	90%-100%	-	
35	වන විද්‍යා පර්යේෂණ ආයතනය විසින් ක්ෂේත්‍ර පර්යේෂණ වගා නඩත්තු කිරීම-09 (පර්යේෂණ බිම් කට්ටි 03 නඩත්තු 03 වරක්)	-	-	(67%) නඩත්තු වාර ගණන- (06)
36	වන විද්‍යා පර්යේෂණ ආයතනය විසින් නව පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය සිදු කිරීම (පර්යේෂණ 03)	100%	-	-
37	වන විද්‍යා පර්යේෂණ ආයතනය විසින් පර්යේෂණ මධ්‍යස්ථාන නඩත්තුව	100%		
38	වන විද්‍යා පර්යේෂණ ආයතනය විසින් පර්යේෂණ වාර්තා සකස් කිරීම (වාර්තා 02)	100%	-	-
39	වන විද්‍යා පර්යේෂණ ආයතනය විසින් බීජ නිෂ්පාදන ප්‍රභව සංවර්ධනය හා නඩත්තුව	-	-	(25%) තේක්ක උද්‍යාන වල බීජ ප්‍රමාණවත් පරිදි නොතිබීම

05 පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

වගුව 05-1: හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%-100%**
වනාන්තර ආරක්ෂා කිරීම,ප්‍රතිස්ථාපනය කිරීම හා ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම	2030 දී 32% දක්වා වන ආවරණය වැඩි කිරීම				
	2022 ඉලක්ක				
	1. හායනයට පත් වනාන්තර හෙක්.4060.2ක් නඩත්තු කිරීම.	1.හායනයට පත් වනාන්තර ඉඩම් ප්‍රතිස්ථාපනය කරන ලද භූමිය.	-	-	75 -100%
	2. හෙක්.188ක ස්වාභාවික පුනර්ජනනීය වනාන්තර ස්ථාපනය කිරීම	2.වනාන්තර ප්‍රතිස්ථාපිත භූමිය.	-	-	75 -100%
	3.හෙක්.306.46ක නැවත වන වගා නඩත්තු කිරීම	3. නැවත වන වගා නඩත්තු කරන ලද භූමිය.	-	-	75 – 100%
	4. කඩොලාන සංරක්ෂණය යටතේ හෙක්. 100ක කඩොලාන වනාන්තර ස්ථාපිත කොට සංරක්ෂණය කිරීම.	4. කඩොලාන සංරක්ෂණය කරන ලද භූමිය.	-	-	75 – 100%
	5. හෙක්. 221.6 ක කඩොලාන නඩත්තු කටයුතු සිදු කිරීම.	5.කඩොලාන සංරක්ෂණය කරන ලද භූමිය.	-	-	75 – 100%

	6. වැව් තාවුළු සංරක්ෂණය යටතේ තෝරාගත් වැව් ආශ්‍රිතව හෙක්. 100.3ක දේශීය ශාක සිටුවීම.	6. සංරක්ෂණය කරන ලද වැව් තාවුළු.	-	-	75 – 100%
	7. පෙර වසරවලදී ස්ථාපිත වැව් තාවුළු ආශ්‍රිත හෙක්.94.7ක වන භූමි නඩත්තු සිදු කිරීම.	7. සංරක්ෂණය කරන ලද වැව් තාවුළු	-	-	75 – 100%
	8. හෙක්. 47ක රණවිරු රුක්රෝපණය සිදු කිරීම	8. වගා කරන ලද භූමිය.	-	-	75 -100%
	9. ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම. හෙක්.80ක නඩත්තු 100ක් සිදු කිරීම.	9. ආක්‍රමණශීලී ශාක ඉවත් කරන ලද භූමිය.	-	-	75 -100%
ස්වභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපී පෙනෙන ක්‍රියා මාර්ග ගැනීම, ජෛව විවිධත්වයට හානි වීම නැවැත්වීම සහ 2020 වන විට තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වඳවී යාම වළක්වා ගැනීම.	සීමා මායිම් අපැහැදිළි වනාන්තර වලින් 10%ක ප්‍රමාණයක මායිම් නිරූපණ කටයුතු සිදු කිරීම.	පැහැදිලි මායිම් සහිත වනාන්තර ප්‍රමාණය 10%කින් වැඩි කිරීම.	-	-	77.19%
2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධතිය සහ	කි.මී.700ක වනාන්තර මායිමේ මායිම් කණු සිටුවීම.	මායිම් කණු සිටුවා ඇති දුර	33.8%	-	-

ඒවායින් ලැබෙන්නා වූ සේවාවන් විශේෂ වනාන්තර කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.	2020 වන ආවරණ සිතියම සැකසීම.	2020 වසරට අදාළ වන ආවරණ සිතියම	-		100%
භායනයට පත් වූ භූමිවල 2021 වර්ෂයේ ස්ථාපිත වාණිජ වන වගා නඩත්තු කිරීම.	හෙක්: 883.5	භායනයට පත් වනාන්තර ප්‍රතිස්ථාපනය වීම.	-	-	90%
කැබිලිත්ත රක්ෂිතය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහන	හෙක්: 1950	භායනයට පත් වනාන්තර ප්‍රතිස්ථාපනය වීම.	-	53%	-

5.2: තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1: වන ආවරණය වැඩිකිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම

ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේ දී රාජ්‍ය අංශය ක්‍රියාත්මක වීම පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන්ගේ ආකර්ෂණය ලබා ගැනීම වඩා ඵලදායී වනු ඇත.

මේ වෙනුවෙන් දේශීය පෞද්ගලික අංශයන්ගේත්, විදේශීය අංශයේත් මූල්‍ය දායකත්වයක් ලබාගත හැකි පරිදි රාජ්‍ය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදු කළ යුතු අතර, ඒ තුළින් අපේක්ෂිත 32% ඉලක්කයට ළඟා වීම වඩා කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇත.

5.2.2.: වෙන්කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කළ ද භාණ්ඩාගාරයෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අපේක්ෂිත මට්ටමින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම.

5.2.3: දැනට සිටින සේවක මණ්ඩලයේ පවතින ඌනතාවය

වනාන්තර මැනුම් කිරීමේ කටයුතු සිදුකිරීමේ දී ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පවතින හිඟතාවය හේතුවෙන් අපේක්ෂිත මට්ටමින් එම කාර්යය ඉටුකිරීමට නොහැකිවීම.

5.2.4.: වනාන්තර ගැසට් කිරීමේ දී විවිධ ආයතනයන්ගෙන් ඇතිවන ප්‍රතිරෝධතා

වනාන්තර ගැසට් කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුලු අනෙකුත් ආයතනයන්ගෙන් ඇතිවන ප්‍රතිරෝධතාවන් මත වනාන්තර ගැසට් කිරීමේ කටයුතු ප්‍රමාදවීම.

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1: සේවක සංඛ්‍යා කළමනාකරණය

වගුව 06-1: සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	89	49	40
තෘතීක මට්ටම	44	20	24
ද්විතියික මට්ටම	1382	1220	162
ප්‍රාථමික මට්ටම	1634	1276	358
එකතුව	**3149**	**2565**	**584**

6.2: ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

- ජ්‍යෙෂ්ඨ - දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සැකසීම, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය හා පවත්වා ගැනීමේ හැකියාව කෙරෙහි දැඩි ලෙස බලපා ඇත.

- තෘතියික - දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන කණ්ඩායම මෙහෙයවීම හා අධීක්ෂණය කෙරෙහි බලපෑම් ඇති කරයි.

- ද්විතියික - වන ආරක්ෂණ හා සංවර්ධන කටයුතු ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වීම.

- ප්‍රාථමික - සුළු සේවක කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන් කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව කිරීමට නොහැක. වනාන්තර සහ නැවත වගාකරන වනාන්තරවල ආරක්ෂාවට මෙන්ම තවාන් කටයුතු හා සංරක්ෂණ මධ්‍යස්ථාන වල මෙම කාර්යාල කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට ගැටළු සහගත වීම.

6.3: මානව සම්පත් සංවර්ධනය

2022 වසරේ බඳවා ගැනීම්

වගුව 06-2: 2022 වසරේ බඳවාගැනීම්

සංවර්ධන නිලධාරී	80

6.4: දේශීය පාඨමාලා

වගුව 06-3: දේශීය පාඨමාලා

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු '000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
1. කාර්යාල ලිපි ගොනු කළමනාකරණය සිංහල- (දකුණු සබරගමු කලාපය)	30	මාර්තු මස 24 හා අප්‍රේල්05 (දින02)	87.5	-	දේශීය	නිසි පරිදි කාර්යාල ලිපි ගොනු කළමනාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම.
2. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (සිංහල 1 හා 2)	75	දින03	187	-	දේශීය	කාර්යාල ගිණුම් කටයුතු නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය දැනුම ලබාගැනීම
3. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය දෙමළ- (උතුරු කලාපය)	25	දින03	125	-	දේශීය	කාර්යාල ගිණුම් කටයුතු නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය දැනුම ලබාගැනීම
4. කාර්යාල ලිපි ගොනු කළමනාකරණය දෙමළ -(උතුරු කලාපය)	25	දින02	119	-	දේශීය	නිසි පරිදි කාර්යාල ලිපි ගොනු කළමනාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම.

5. කාර්යාල උපකරණ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	5	දින02	37.5	-	දේශීය	ගබඩා පාලනය ,බඩු වට්ටෝරු පොත්, භාණ්ඩ සමීක්ෂණ , කාර්යාල උපකරණ මිලදී ගැනීම් හා පාලනය පිළිබඳ දැනුම ලබාගැනීම.
6. Microsoft Office පුහුණුව	6	දින03	90	-	දේශීය	එදිනෙදා රාජකාරී කටයුතු වලට අවශ්‍ය Microsoft office පිළිබඳ අවබෝධයක් හා word, Excel, Power point, Internet ආදිය පිළිබඳ දැනුම ලබාගැනීම
7. Advanced Excel පුහුණුව	8	දින02	96	-	දේශීය	දත්ත කළමණාකරණ යට අවශ්‍ය Advanced Excel කුසලතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
8. Training Need Analysis	2	දින02	15	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරි පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා පුහුණුවක් ලබාගැනීම
9. වනාන්තර භූමි දර්ශන ප්‍රතිස්ථාපනය පිළිබඳ පුහුණු	482	දින03 බැගින් 03 වරක් පැවැත්විණි (සිංහල හා දෙමළ මාධ්‍ය)	-	2581.496	දේශීය (මාර්ගගත හා ක්ෂේත්‍ර පුහුණු)	වනාන්තර භූ දර්ශන ඒකාබද්ධ කළමණාකරණ යක් තුළ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුනාගැනීම.
10. ආකල්ප සංවර්ධන පුහුණුව	30	01	60	-	-	-

11. කාර්යක්ෂමතාවය ඔප්නැංවීම සඳහා ආකල්ප සංවර්ධන පුහුණුව	25	02	204.33	-	-	-
12. වෘක්ෂ විද්‍යා පරීක්ෂණය	15	03	195	-	-	-
13. Virtual Training Program on High - Tech Forest Nurseries for Officials of Department of Forest Conservation, Sri Lanka	53	දින03	-	නොමිලේ	විදේශීය (මාර්ගගත) ඉන්දියාව	වන පැළ තවාන් වල තාක්ෂණික භාවිතය පිළිබඳ දැනුම
14. Sustainable Forest Management for Poverty Reduction and Food Security in Thailand Harmonizing Local People and Forest in the Context of Sustainable	03	දින10	-	නොමිලේ	විදේශීය (මාර්ගගත) තායිලන්තය	දිළිඳු බව පිටුදැකීම හා ආහාර සුරක්ෂිතභාවය සඳහා තිරසාර වන කළමණාකරණය භාවිතය
15. Sufficiency Economy Policy (SEP) in Community Based Economic Development	02	දින10	-	නොමිලේ	විදේශීය (මාර්ගගත) තායිලන්තය	ප්‍රජා මූලික ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ලබාදීම
16. Seminar on Forest Law Enforcement and Governance (FLEC) for officials from Developing Countries,	11	දින10	-	නොමිලේ	විදේශීය (මාර්ගගත) චීනය	වන නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ හැකියා වර්ධනය

17. Seminar on Import and Export Management and Protection of Endangered Species for officials from Developing Countries,	07	දින20	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	තර්ජනයට ලක්වූ ජීවීන් විශේෂ සංරක්ෂණය හා ආනයන /අපනයන කළමණාකරණය
18. Seminar on Implementation of United Nations Forest Instrument (UNF) and Sustainable Forest Management for Developing Countries.	05	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)	තිරසාර වන කළමණාකරණ පිළිබඳ දැනුම වර්ධනය කිරීම
19. Seminar on Implementation Combat Desertification (UNCCD) and Sandstorm Prevention for Senior Officials from Belt and Road Invitation Countries.	06	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	කාන්තාරීකරණය හා වැලි කුණාටු වැළැක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
20. Seminar on Wildlife Protection and CITES Implementation for Developing Countries	07	දින14	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	වන ජීවී ආරක්ෂණය හා තර්ජනයට ලක්වූ ජීවී විශේෂ වෙළඳාම පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
21. Seminar on Sustainable Forest Management and Development for Officials from Developing Countries,	09	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	තිරසාර වන කළමණාකරණය හා සංවර්ධනය පිළිබඳ දැනුම වර්ධනය කිරීම

22. Seminar on Capacity Building for Young Officials from Developing Countries	04	දින08	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	නවක නිලධාරින්ගේ හැකියා වර්ධනය කිරීම පිළිබඳ පුහුණුවක් ලබාගැනීම
23. Seminar on Forest Resources and Ecological Value Management for Developing Countries.	04	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	වන සම්පත් හා පාරිසරික අගයන් කළමණාකරණය පිළිබඳ පුහුණුව
24. Training Course on Integrated Pest Management of Tropical Crops for Developing Countries,	04	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	ඒකාබද්ධ පලිබෝධ පාලන ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම
25. Seminar on Wetland Conservation and Management for Ramsar Member Countries	09	දින03	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	තෙත්බිම් සංරක්ෂණය හා කළමණාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම
26. Seminar on Pomiculture Techniques for officials from Developing Countries	14	දින09	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	පළතුරු බෝග වගාව පිළිබඳ දැනුම හැකියාව වර්ධනය කිරීම
27. Seminar on Forest Comprehensively Sustainable Development under South-South Cooperation for Developing Countries	08	දින06	-	නොමිලේ	විදේශීය (මාර්ගගත)චීනය	වනාන්තර වල තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීම
28. Seminar on Bamboo Industry and Green Economy Development for Developing Countries	17	දින15	-	නොමිලේ	විදේශීය (මාර්ගගත) චීනය	උණ කර්මාන්තයේ වැඩිදියුණු කිරීම සඳහා විභවය හඳුනාගැනීම

6.5:2022 වසරේ විශ්‍රාම ගැනීම්

අදාළ කාල වකවානුව තුළ පහත සඳහන් තනතුරු දරණ ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

වගුව 06-4: 2022 වසරේ විශ්‍රාම ගැනීම්

විශේෂ වන පාලක	04
වන පාලක	03
අඩවි වන නිලධාරී	07
කළමනාකරණ සේවා නිලධාරි	03
බීට්ටු වන නිලධාරී	17
වන ව්‍යාප්ති නිලධාරී	02
වන ක්ෂෙත්‍ර සහකාර	14
රියදුරු	03
කාර්යාල කාර්ය සහයක	01
වගා මුරකරු	01
වගා කම්කරු	07
කම්කරු	01

6.6: සේවයෙන් ඉල්ලා අස්වීම් /තනතුරුවලින් නිදහස් වීම

වගුව 06-5: සේවයෙන් ඉල්ලා අස්වීම්/තනතුරුවලින් නිදහස් වීම

කාර්යාල කාර්ය සහයක	01
සංවර්ධන නිලධාරි	01

6.7: මියගිය නිලධාරින් පිළිබඳ විස්තර

වගුව 06-6: මියගිය නිලධාරින් පිළිබඳ විස්තර

රියදුරු	02
කාර්යාල කාර්ය සහයක	01
වගා කම්කරු	01

6.8: විනය කටයුතු

වගුව 06-7: විනය කටයුතු

වැඩ තහනම් කිරීම්	03
නැවත සේවයේ පිහිටුවීම	02
වර්ෂය තුළ ආරම්භ කළ විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ	27

6.9: සේවය අත්හැර යාම්

වගුව 06-8: සේවය අත්හැර යාම්

අඩවි වන නිලධාරි	01

6.10: දෙපාර්තමේන්තු විභාග

1. අඩවි වන නිලධාරි, බීට්ටු වන නිලධාරි, වන ව්‍යාප්ති නිලධාරි සහ වන කේෂ්ත්‍ර සහකාර තනතුරු සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වන නීතිය) - 2022.11.12
2. ඒකාබද්ධ රියදුරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022.09.14
3. වෘක්ෂ විද්‍යා පරීක්ෂණය-වන කේෂ්ත්‍ර සහකාර - 2022.10.04
4. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022.11.17
5. ඒකාබද්ධ කාර්යාල කාර්ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022.11.16
6. වෘක්ෂ විද්‍යා පරීක්ෂණය (මධ්‍යම මට්ටම) බීට්ටු වන නිලධාරි, වන ව්‍යාප්ති නිලධාරි -2022.12.23

6.11: පුහුණු වැඩසටහන්

වගුව 06-9 : වෙනත් පුහුණු

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
වන විද්‍යා පුහුණු වැඩසටහන	04	02				
වනාන්තර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන	04	01				
වනාන්තර GPS උපකරණ මගින් කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම	03	01				

ජාතික වන සංගණනය පිළිබඳ පුහුණු වැඩසටහන	807	දින 01 බැගින් වැඩසටහන් 23				
කැළෑ ගිනි පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	17	01	44,750	-	දේශීය	කේෂ්ත්‍ර නිලධාරින්ගේ ගිනිනිවීම පිළිබඳ ආකල්ප වැඩි දියුණුකිරීම හා ගිනි නිවීම පිළිබඳ දැනුවත් කිරීම
කැළෑ ගිනි පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	18	01		-	දේශීය	
ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම	11	01				
මුදල් රෙගුලාසි, කාර්ය පටිපාටික රීති හි වැඩ පියවර සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	35	03			දේශීය	අදාල කේෂ්ත්‍රයට අයත් දැනුම
5S සංකල්පය පිළිබඳ පුහුණු වැඩසටහන	223	04				
ලේඛන අපහරණය පිළිබඳ පුහුණු වැඩසටහන	156	02				
කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන - 1 අදියර	42	01				
කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන - 02 අදියර	45	01			දේශීය	අදාල කේෂ්ත්‍රයට අයත් දැනුම
තොරතුරු පනත පිළිබඳ පුහුණු වැඩසටහන	51 සජීවීව 86 මාර්ගගතව	01				
විධිමත් විනය පරීක්ෂණය	38	03				

පිළිබඳ පුහුණු වැඩසටහන -1						
කාර්යාල ක්‍රම හා තොරතුරු පනත	40	01				
විධිමත් විනය පරීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන -2	28	03				

6.12: ණය ලබාදීම

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට අයත් නිලධාරින්ට රජයේ සේවකයන්ට හිමි ණය යටතේ පහත සඳහන් ණය ලබා දී ඇත.

1. ආපදා ණය 51ක්
2. දේපල ණය 07ක් ලබා දී ඇත.

6.13: තොරතුරු අයිතිවාසිකම් ඒකකය

1.මෙම දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන් පහත පරිදි වර්ග කළ හැක.

- පුරවැසියන් - 43
- රාජ්‍ය නොවන සංවිධාන - 13

56

2. ඉල්ලුම් කළ තොරතුරු පහත පරිදි වර්ගීකරණය කළ හැක

- ව.සං.දෙ.ඉඩම් පිළිබඳ ගැටළු - 17
- වන රක්ෂිත පිළිබඳ ගැටළු - 12
- කාර්යය මණ්ඩල ආයතන අංශයේ ගැටළු - 11
- විවිධ තොරතුරු ලබා ගැනීම - 16

56

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

7.1:අනුකූලතා වාර්තාව

වගුව 07-1: අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			

5.1	විගණකාධිපතිවරයා විසින් නියමක ොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ .134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සම ඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවක ටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සියලුම වාර්තා සඳහා මාසයක් තුළ පිළිතුරු සපයා නොමැත. ගැටලුවේ සංකීර්ණතාවය නිසා සමහර පිළිතුරු සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ.	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම. නිපුණතා සංවර්ධනය.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව ,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			

8.1	අංක 2017/01 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 07 වන පරිච්ඡේදය අනුව ,වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා තිබීම කර අපහරණය දී කාලයක අඩු	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	පැවති කොරෝනා වසංගතය හා QR ක්‍රමවේදය අනුව ඉන්ධන ලබා ගැනීමේ අපහසුතා හේතුවෙන් පූර්ණ වශයෙන් ඉන්ධන ලබා ගැනීමට නොහැකි වීම.	පූර්ණ වශයෙන් ඉන්ධන ලබා ගැනීමට හැකි වූ විගස නියමිත පරිදි ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කිරීම.

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම	අනුකූල නොවේ	දිසා වන කාර්යාල හා කලාප කාර්යාල 28කින් ආදායම් එකතු කෙරේ .ඇතුළත් කිරීම් ගණන ඉහළ බැවින් ආදායම් ප්‍රභවය හඳුනාගැනීම දුෂ්කර විය.	වගකිවයුතු නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය හිමියන් සහ ඇපකරුවන් සොයා ගැනීම දුෂ්කර විය .සමහර නිලධාරීන් පත් මරණයටවීම, වැඩ තහනමට ලක්වීම, සේවය ආදී අත්හිටුවීම විය හේතු කරුණු	ණය හිමියන් හෝ ගණුදෙනුකරුවන් සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ571 . ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	අනුමත කාර්යය මණ්ඩල සංඛ්‍යාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නොලැබීම.	පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	වෙබ් අඩවිය යාවත්කාලීන කර නොමැත.	තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී.
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 2008/05 හා 2018/05(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2018/02 ඇමුණුම 02ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	තිබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයන්ට ගැලපෙන පරිදි පුහුණු සැලැස්මක් සකස් කර ඇත	නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇත.ඒ අනුව පුහුණු ලබා ගැනීම සඳහා පුහුණු සැලැස්මක් සකස් කරමින් පවතී.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛය 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		